# පුරවැසි කතිකාවතකට පෙරවදනක්

ලයනල් ගුරුගේ

CPA

# පුරවැසි කතිකාවතකට පෙරවදනක්

ලයනල් ගුරුගේ

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

**පුරවැසි කතිකාවතකට පෙරවදනක්**

ප්‍රථම මුද්‍රණය 2014 ජනවාරි

ISBN - 978-955-4746-29-9

පරිගණක නිමැවුම : **වාක්‍යා රූ** 011-2708377

පිටකවර නිර්මාණය : **කේ.ඩබ්ලිව්. ජනරංජන** 077-7304121

මුද්‍රණය : **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්** 011 2329739

ප්‍රකාශනය : **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යාවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

වැඩිදුර විස්තර සඳහා
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
(ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය)
32/7, මල් පාර, කොළඹ 07
දුරකථන : 011-2370801-4 ෆැක්ස් : 011-2370802
ඊමේල් : cpa@cpalanka.org
වෙබ් : www.cpalanka.org

**පටුන**


පුරවැසි කතිකාවතකට පෙරවදනක් **7**

පුරවැසියා යනු කවරෙක්ද? **9**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව **35**

ජාතික පොලිස් කොමිෂන් සභාව **39**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව **41**

ඔම්බුඩ්ස්මන් **43**

පාර්ලිමේන්තු කාරක සභා **47**

ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය **53**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය **58**

විගණකාධිපති දෙපාර්තමේන්තුව **60**

අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව **62**

අධිකරණ සේවා කොමිෂන් සභාව **65**

මැතිවරණ දෙපාර්තමේන්තුව **67**

පාරිභෝගික සේවා කටයුතු අධිකාරිය **79**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව **81**

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය **83**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය **85**

රාජ්‍ය භාෂා කොමිසම **88**

ශ්‍රී ලංකාවේ පුරවැසියන්හට තම දුක්ගැනවිලි ඉදිරිපත් කරන්නට ඇති ආයතන **95**

## පුරවැසි කතිකාවතකට පෙරවදනක්

ශ්‍රී ලංකාවේ පුරවැසි කතිකාවත දුබල මට්ටමක පැවතීමේ ප්‍රතිඵලය ලෙස බලය හිමි තැනැත්තා අවවරප්‍රසාදි. පුද්ගලයන් පීඩාවට පත් කිරීමේ ප්‍රවනතාවක් දක්නට ලැබේ. පුරවැසි කතිකාවත ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ශක්තිමත් කරන පදනම ලෙස හැඳින්විය හැකි ය. ඒ සඳහා දැනුවත්භාවයක් තිබීම පුරවැසියාට වැදගත් වේ. එහි දී වැදගත් වන කරුණු කිහිපයකි.

1. යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම සඳහා දැනට තිබෙන ව්‍යුහයන් හඳුනා ගැනීම.
2. එම ව්‍යුහයන්හි සාධනීය පැති මෙන් ම සීමා හඳුනා ගැනීම.
3. නව ව්‍යුහයන් නිර්මාණය කිරීමට දිරිමත් කිරීම.

මේ සඳහා පුරවැසියන්ට අයිතියක් ඇති බව හඳුනා ගැනීම මුල් පියවර ය. එහෙත් බොහෝ විට එබඳු ක්‍රියාකාරිත්වයන් අභියෝගයට ලක්වෙයි. ඒවාට බාධා පැමිණෙයි. අභූත චෝදනා එල්ල වෙයි. එසේ සිදුවන්නේ යහපාලනය ගොඩ නැගීමෙන් අවාසි සිදුවන බලවේගවල ක්‍රියාකාරිත්වය හේතුවෙනි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භයේ සිට ම ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය ශක්තිමත් කිරීම උදෙසා පුරවැසියා බලගැන්වීම ක්‍රියාදාමය වෙනුවෙන් අපි දිගින් දිගටම පෙනී සිටියෙමු. පර්යේෂණාත්මකව හා වැඩමුළු තුළින් ද විවිධ ලිපි ලේඛන තුළින් ද පුරවැසියා පිළිබඳ සංවාදයේ දිගින් දිගටම නිරතව සිටී.

පුරවැසියාගේ අයිතිය හා පුරවැසියාගේ ක්‍රියාකාරිත්වය විෂය කරගනිමින් ලියැවෙන මේ කුඩා ග්‍රන්ථය ප්‍රබුද්ධ පුරවැසි කතිකාවතක් නිර්මාණය කිරීමේ දුෂ්කර වෑයම සඳහා ආලෝකයක් විහිදනු ඇත යන්න අපගේ අදහසයි. ප්‍රාර්ථනයයි.

**ලයනල් ගුරුගේ**

ජ්‍යෙෂ්ඨ පර්යේෂක
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
2014.01.29

## පුරවැසියා යනු කවරෙක් ද?

සියලු මනුෂ්‍යයන් නිදහස් ව උපත ලබා ඇති හෙයින් ගරුත්වයෙන් හා අයිතිවාසිකම්වලින් සමාන වන බව මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි පළමු වගන්තියෙහි ම දැක්වෙයි. පොදුවේ මානව සංහතියට හිමි එම අයිතිවාසිකම ඕනෑ ම රටක ජීවත් වන සෑම පුරවැසියකුට ම අදාළ ය. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින යම් රටක ජීවත් වන හැම පුරවැසියකුට ම හිමි එම අයිතිවාසිකමට අමතර ව එම රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කොට ඇති අයිතිවාසිකම් ද පවතී. පුරවැසියාගේ අයිතිවාසිකම් මෙන් ම පුරවැසියාගේ යුතුකම් ද යහපත් පුරවැසි සමාජයක් පැවතීම කෙරෙහි බලපායි.

සියලු පුරවැසියෝ සමානයෝ ය. ඔවුහු කොන් කිරීම්වලට අසමානකම්වලට ලක් නොකරනු ලැබිය යුත්තාහ.

**පොදුවේ මානව සංහතියට හිමි එම අයිතිවාසිකම ඕනෑ ම රටක ජීවත් වන සෑම පුරවැසියකුට ම අදාළ ය. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින යම් රටක ජීවත් වන හැම පුරවැසියකුට ම හිමි එම අයිතිවාසිකමට අමතර ව එම රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කොට ඇති අයිතිවාසිකම් ද පවතී.**

**පුරවැසියා, දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ඔහු සමාජීය සත්වයෙකි. ඔහුට හුදෙකලාව ජීවත්විය නොහැක. සියල්ල වන්නේ කරුමයට හෝ පෙර පිනට අනුව යැයි සිතන චින්තන ක්‍රමය ඔහු පිළිනොගනී.**

එහෙත් මේ පිළිගැනීම හා එකඟතාව ව්‍යවස්ථාවේ වගන්තිවලට සීමා කරනු ලැබීම හා භාවිතය අතර ඇති වෙනස අඩුවැඩි වශයෙන් ඕනෑම රටක දැකිය හැක්කකි. දියුණු පුරවැසි සමාජයක පුරවැසි අභිමානයක් පවතී. ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති අයිතිවාසිකම් ඔහුට හිමි ය. විරුද්ධ මත දැරීමේ අයිතිය ඔහුට ඇත. තමන් කැමති ආගමක් ඇදහීමේ, කැමති භාෂාවක් කතා කිරීමේ හැකියාව ඔහුට ඇත. එමෙන් ම පුරවැසියකු හැටියට ඔහු අනෙකාගේ අයිතිවාසිකමට ගරු කරයි. පුරවැසියකු හැටියට රට තුළ පිළිගත් සම්ප්‍රදායන්ට ගරු කිරීමට ද, ව්‍යවස්ථාපිත නීතියට එකඟව කටයුතු කිරීමට ද ඔහු බැඳී සිටී.

එහෙත් එම තතු මහජනයා පීඩාවට පත් කරන ව්‍යුහයක් හැටියට ක්‍රියාත්මක වන කල්හි ඒවාට එරෙහි ව කටයුතු කිරීම ද දියුණු පුරවැසියාගේ ලක්ෂණයකි.

පුරවැසියා, දේශපාලන ක්‍රියා--කාරිකයෙකි. ඔහු සමාජීය සත්වයෙකි. ඔහුට හුදෙකලාව ජීවත්විය නොහැක. සියල්ල වන්නේ කරුමයට හෝ පෙර පිනට අනුව යැයි සිතන චින්තන

ක්‍රමය ඔහු පිළිනොගනී. සමාජයට අහිතකර අප්‍රිය, තත්ත්වයන් සමාජයේ හිතසුව පිණිස, වෙනස් කිරීම සඳහා ඔහු සක්‍රියව දායක වෙයි. ඒ සඳහා දේශපාලන දැනුම ඔහුට වැදගත් වෙයි. ඉන්දියාවේ නවදිල්ලි ප්‍රාන්තයේ මැතිවරණ ජයග්‍රහණය ලැබූ අර්වින්ද් කෙජ්රිමාල්ට වඩා බලවත් වූයේ අන්නා හසාරි විසින් මාරාන්තික උපවාසයකට නායකත්වය දීමයි. දූෂණයෙන් තොර දේශපාලන නායකත්වයක් ඉල්ලා සිටි ජනතාවගේ ඡන්දයෙන් ඔහු බලය දිනාගත් නායකයෙකි.

**රජුන්ගේ පටන් සාමාන්‍ය පුරවැසියා දක්වා නීතියේ ආධිපත්‍යයට යටත් විය යුතු ය. නීතියේ පාලනයෙන් බැහැර වූ රටක ඇති වන්නේ අරාජික තත්වයකි.**

## නීතියේ ආධිපත්‍යය හා පුරවැසියා

රජුන්ගේ පටන් සාමාන්‍ය පුරවැසියා දක්වා නීතියේ ආධිපත්‍යයට යටත් විය යුතු ය. නීතියේ පාලනයෙන් බැහැර වූ රටක ඇති වන්නේ අරාජික තත්වයකි.

බ්‍රිතාන්‍යයේ රාජාණ්ඩු පාලන කාලයේ රජවරුන් නීතියේ ආධිපත්‍යය තමන් අතට ගැනීමෙන් පුරවැසියන් පීඩාවට පත් කිරීම සීමා කිරීම සඳහා 1215 දී මැග්නාකාර්ටා ආඥා පණත ඇති කර ගන්නා ලදි. ඊට හේතු වූයේ පුරවැසියන් සහ රජුන් අතර ගැටුම් ඇති වීම ය. නීතියේ ආධිපත්‍යය හා

**වෝටර්ගේට් සිද්ධියේ දී ජනාධිපති නික්සන්ට තනතුර හැර යෑමට සිදු වූයේ අනුන්ගේ තොරතුරුවලට හොරෙන් සවන්දීම මගින් පුරවැසි අයිතිවාසිකම් කඩ කළ වරද නිසා ය.**

අධිකරණයේ නිදහස ශක්තිමත් කිරීම නිසා එංගලන්තයේ රාජ්‍ය නායකයාට හා දේශපාලන ප්‍රභූවරුන්ට ඇති අයිතිවාසිකම් සාමාන්‍ය පුරවැසියාට ද පවතී. මේ නිසා 2013 වසරෙහි එංගලන්තයෙහි කථානායකවරයකුට හා ඇමතිවරයකුට ඉල්ලා අස්වන්නට සිදු විය. වෝටර්ගේට් සිද්ධියේ දී ජනාධිපති නික්සන්ට තනතුර හැර යෑමට සිදු වූයේ අනුන්ගේ තොරතුරුවලට හොරෙන් සවන්දීම මගින් පුරවැසි අයිතිවාසිකම් කඩ කළ වරද නිසා ය. නාවුරු දූපත්වල ප්‍රංශ සමාගමක් විසින් කරන ලද ආකර කැණීම් නිසා එරට ජීවත් වන පුරවැසියන් හට බීමට වතුර පොදක් පවා නැති වන මට්ටමක් උදා විය. ප්‍රංශ සමාගම කැණීම්වලින් පසුව ඉවත් ව ගිය ද ජාත්‍යන්තර අධිකරණයෙහි පැවරුනු නඩුවක් විභාග කිරීමෙන් පසුව, ප්‍රංශයේ ජීවත් වන පුරවැසියාට ඇති අයිතිය ම නාවුරු දූපත්වල ජීවත්වන පුරවැසියා හට ද ඇති බව අධිකරණය තීන්දු කළ බැවින් එම දූපත්වල වැසියන්ට වන්දි ගෙවීමට ප්‍රංශ රජයට සිදු විය. මේ නඩුව විභාග කරන ලද්දේ කීර්තිමත් ශ්‍රී ලාංකීය විනිසුරුවරයකු වන සී.ජී. වීරමන්ත්‍රී මහතා විසිනි.

## නිදහස් ඡන්ද අයිතිය හා පුරවැසියා

තමන් කැමති දේශපාලන පක්ෂයකට ඡන්දය ප්‍රකාශ කරන්නට ලැබීම සෑම පුරවැසියකුගේ ම අයිතියකි. එහෙත් එම අයිතිවාසිකම් කඩ වන අවස්ථා තිබේ.

1999 ජනවාරි මස 25 වැනි දින පවත්වන ලද ශ්‍රී ලංකාවේ, වයඹ පළාත් සභා ඡන්දය පුරවැසියා සතු එම අයිතිවාසිකම දරුණු ලෙස උදුරාගත් අවස්ථාවක් හැටියට ඉතිහාස ගත වෙයි.

ඡන්දපොළට ඇතුළු වී ඡන්දදායකයන්ට පහර දී ඡන්දය මංකොල්ලකන්නන් ආරක්ෂා කිරීමේ හා ඡන්දපොළ ආරක්ෂා කර ගැනීම සඳහා පැමිණි පුරවැසියන්ට පහර දීමේ හා අත් අඩංගුවට ගැනීමේ ප්‍රතිපත්තියක් ද එහි දී ක්‍රියාවට නැංවිණි.

කැකුණගොල්ල ඡන්ද මධ්‍යස්ථානයේ තේරීම් භාර නිලධාරී ඇතුළු පිරිසක් විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කොට තිබුණේ නීතිවිරෝධී ලෙස හා අයුතු ලෙස රංචු ගැසීම, හා දේපලවලට හානි කිරීම යන චෝදනා නගමිනි. "මේ චෝදනා පිළිගත නොහැකියි. මෙම ඡන්දදායකයන් ඡන්ද පොළට

**තමන් කැමති දේශපාලන පක්ෂයකට ඡන්දය ප්‍රකාශ කරන්නට ලැබීම සෑම පුරවැසියකුගේ ම අයිතියකි. එහෙත් එම අයිතිවාසිකම් කඩ වන අවස්ථා තිබේ.**



යන විට ඒ අයගේ ඡන්ද දමා අවසන්. ඡන්ද නිලධාරීන් ඔවුන්ට ආපසු යන්න කියලා පොලීසිය බලා ඉද්දීමයි මැරයන් ඡන්දය දමා තිබෙන්නේ."

විත්තියේ නීතිඥයෝ ප්‍රකාශ කළහ. ජනතාවට නීතියෙන් හිමි ව තිබෙන ඡන්ද අයිතිය ආරක්ෂා කර දෙමින් සාමය රැක ගැනීමට කටයුතු කළ යුතු පොලීසිය තම රාජකාරිය හරි හැටි ඉටු කර නැහැ." ඔවුහු කීහ.

පාර්ලිමේන්තු මැතිවරණ පණතෙහි 48 වගන්තිය අනුව,

(1) යම්කිසි ස්වාභාවික සිද්ධි ඇති වීමේ හේතුවෙන් (අ) ඡන්ද විමසීම ආරම්භ කිරීමට නියමිත වේලාවේ දී ඡන්ද පොළක ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකි වන්නා වූ හෝ

(ආ) ඡන්ද විමසීම පටන් ගැනීමට නියමිත වෙලාවේ දී ඒ ඡන්ද පොළහි ඡන්ද විමසීම ආරම්භ වූ නමුත් ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා නියමිත වෙලාව තෙක් එය පවත්වාගෙන යා නොහැකි වන්නා වූ හෝ



(ඇ) ඒ ඡන්ද පොළට වෙන් කර දෙන ලද කවර හෝ ඡන්ද පෙට්ටියක් ගණන් කිරීමේ නිලධාරියා වෙත බාරදීමට නොහැකි වන්නා වූ අවස්ථාවක, ඒ ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් අප්‍රමාද ව ඒ බව තේරීම් භාර නිලධාරියා වෙත දැන්විය යුතු අතර, ඔහු එය මැතිවරණ කොමසාරිස්වරයාට දැනුම් දිය යුතු ය.

(2) මැතිවරණ කොට්ඨාසයක ඡන්ද පොළක් සම්බන්ධ ව (1) වන උප වගන්තිය යටතේ දැනුම් දීමක් ලැබුණු විට, ඒ දැනුම් දීමේ ශක්‍යතාව තීරණය කිරීම අවශ්‍ය යැයි කොමසාරිස්වරයා විසින් සලකනු ලැබිය හැකි විමසීම් කිරීමෙන් පසු ව, ඒ ඡන්ද පොළෙහි පවත්වන ලද ඡන්ද විමසීම ශූන්‍ය බවට ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

1999 අප්‍රේල් 6 දා පැවති මධ්‍යම පළාත් සභා මැතිවරණයේ දී සිදු

**රාජ්‍ය සේවය පුරවැසියාගේ යහපත පිණිස සඳහා මිස ඔහු හෝ ඇය පීඩාවට පත් කරන්නාක් නොවිය යුතු ය.**

වූ දූෂණ හා අක්‍රමිකතා හේතුවෙන් නිදහස් ඡන්දයකට තමන්ට ඇති මූලික අයිතීන් කඩ වූ බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා මහනුවර උඩුදුම්බර ප්‍රදේශයේ ඡන්දදායකයන් සිව් දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමක් සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය එම මැතිවරණයේ දී මහනුවර දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 23ක සාධාරණ ඡන්දයක් නො පැවැති බවත් මැතිවරණ දූෂණ සිදු වී ඇති බවටත් තීරණය කර ඒ හේතුවෙන් මූලික අයිතිවාසිකම් කඩ වී ඇති ඡන්දදායකයන් සිව් දෙනාට නඩු ගාස්තු ගෙවන ලෙස නියෝග කළේ ය. මැතිවරණයක් නිදහස්, සමාන, සාධාරණ හා රහස්‍ය (Free and sair Equal and in secrecy) විය යුතු හෙයින් ඡන්ද පොළට කඩා වැදීමක දී එම මූලධර්ම සියල්ල අහෝසි වේ.

## නිදහස් රාජ්‍ය සේවය හා පුරවැසියා

රාජ්‍ය සේවය පුරවැසියාගේ යහපත සඳහා මිස ඔහු හෝ ඇය පීඩාවට පත් කරන්නාක් නොවිය යුතු ය.

දේශපාලන බලය ලබා ගන්නන් රාජ්‍ය සේවය තම බලය පවත්වාගෙන

යැමේ අවියක් බවට පත් කර ගත් විට රාජ්‍ය සේවකයා පුරවැසියාගේ අයිතීන්ට ගරු නොකරන්නකු හා පීඩකයකු බවට පත් වේ. අනෙක් අතින් රාජ්‍ය සේවකයා ද පුරවැසියෙකි. ස්වාධීන රාජ්‍ය සේවයක යෙදීමේ අයිතිය ඔහුගෙන් පැහැර ගැනීම ද පුරවැසියෙකු හැටියට ඔහුගේ අයිතිවාසිකම කඩ කිරීමකි.

**රාජ්‍ය සේවකයා ද පුරවැසියෙකි. ස්වාධීන රාජ්‍ය සේවයක යෙදීමේ අයිතිය ඔහුගෙන් පැහැර ගැනීම ද පුරවැසියෙකු හැටියට ඔහුගේ අයිතිවාසිකම කඩ කිරීමකි.**

ලොව දියුණු රටවල නිදහස් රාජ්‍ය සේවයක පැවැත්ම නීතිය මගින්ම තහවුරු කර ඇත්තේ එනිසා ය. එසේ නොකිරීම සමස්ත රාජ්‍ය සේවයම දුබල බවට පත් කර එය දේශපාලන අතකොලුවක් වෙමින් යහපාලනය වළපල්ලට යවයි. දේශපාලන පලිගැනීම් නිසා සිදුවන ස්ථානමාරුවීම් වැඩ තහනමට ලක් කිරීම්, බොරු චෝදනා ගොනු කොට අත්අඩංගුවට ගැනීම් චරිත ඝාතන හා ඇතැම් විට අත්අඩංගුවට ගැනීම් දක්වා මේ අශෝබන ක්‍රියාමාර්ගය දිගු විය හැකි ය. ශ්‍රී ලංකාවේ සුබ සාධන වැඩසටහන් අතීතයෙහි සිට ම ක්‍රියාත්මක වූයේ දේශපාලන ඇමක් ලෙස ය. ජීවන තත්වයෙන් පහළ මට්ටමක සිටින පුරවැසියන් පෝෂණ මට්ටමෙන්

**සුභ සාධන කටයුතු භාරව ක්‍රියා කරන නිලධාරීන් හැටියට ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි නිලධාරීන් යනාදීන්ට පැවරෙනුයේ අපක්ෂපාතීව සේවය කිරීමේ වගකීමකි.**

ඉහළට ගැනීම සඳහා ක්‍රියාත්මක විය යුතු වූ මෙය ඡන්ද ගුණ්ඩුවක් බවට පත් විය. හාල් පොත, ආහාර මුද්දරය, ජනසවි කාඩ්පත හා සමෘද්ධි බලපත්‍රය යනාදී වශයෙන් දුප්පතුන් මෙල්ල කරන හෙණ්ඩුවක් හැටියට බොහෝ දේශපාලකයෝ මෙය භාවිතයට ගත්හ.

සුභ සාධන කටයුතු භාරව ක්‍රියා කරන නිලධාරීන් හැටියට ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි නිලධාරීන් යනාදීන්ට පැවරෙනුයේ අපක්ෂපාතීව සේවය කිරීමේ වගකීමකි. එහෙත් මෙය දරුණු අන්දමින් අර්බුදයට යනුයේ මැතිවරණ ආසන්නයේදී ය. මෑත ඉතිහාසයෙහි සමෘද්ධි නිලධාරීන් ආණ්ඩුවේ ඡන්ද ව්‍යාපාරය සඳහා ඍජුවම සම්බන්ධ කර ගන්නට පටන් ගැනුණි.

එහෙත් රාජ්‍ය නිලධාරීන් මුහුණ දෙන මේ අභාග්‍යයන්ට පිළියම් වශයෙන් මූලික අයිතිවාසිකම්වල ප්‍රතිපාදන පවතී. මෙය බලාත්මක වූ අවස්ථාවක් දක්වීම සුදුසු ය.

1997 මාර්තු 5 දින නියෝජ්‍ය කථානායක අනිල් මුණසිංහගේ අතිසනින් මතුගම ප්‍රදේශයේ සමෘද්ධි නියාමකවරුන්ට ලිපියක් ලැබිණ.

එහි සඳහන් වූයේ ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී තම පක්ෂයේ අපේක්ෂකයන්ට සහයෝගය පිණිස සමෘද්ධි නියාමකවරුන් මැතිවරණ ව්‍යාපාරයෙහි යෙදිය යුතු බව ය.

මෙහි දී නෑබොඩ සමෘද්ධි නියාමකවරයකු වූ ඩී. රංජිත් රූපසිංහ සමෘද්ධි නියාමකයන් කැඳවා පැවැත් වූ රැස්වීමේ දී මෙයට විරුද්ධත්වය පළ කළේ ය. එහි ප්‍රතිඵලය වූයේ දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම්වරිය විසින් ඔහුගේ සේවය අත්හිටවනු ලැබීම ය. මීට එරෙහිව සමෘද්ධි නියාමකවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කළේ ය.

වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය නිසා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 12(2) වගන්ති මගින් ලබා දී ඇති මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බව අධිකරණයේ නිගමනය විය.

රාජ්‍ය සේවකයකුට තමන් කැමති දේශපාලන මතයක් දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීම අධිකරණයේ දෝෂ දර්ශනයට ලක් විය. ඒ අනුව තම පුද්ගලික මුදලින් පෙත්සම්කරුට

**රාජ්‍ය සේවකයකුට තමන් කැමති දේශපාලන මතයක් දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීම අධිකරණයේ දෝෂ දර්ශනයට ලක් විය. ඒ අනුව තම පුද්ගලික මුදලින් පෙත්සම්කරුට වන්දි ගෙවීමට ශ්‍රේෂ්ඨාධිකරණය වගඋත්තර කරුවන්ට නියෝග කළේ ය.**

**සමෘද්ධි නියාමකවරුන් අනිසි ලෙස දේශපාලන කටයුතුවල යොදවන පුද්ගලයන්ට එරෙහිව පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන්ට එරෙහිව පියවර ගැනීම සඳහා නඩු තීන්දුවේ පිටපතක් විගණකාධිපතිවරයාට යොමු කරන ලදි.**

වන්දි ගෙවීමට ශ්‍රේෂ්ඨාධිකරණය වගඋත්තරකරුවන්ට නියෝග කළේ ය.

ඊට අමතරව සමෘද්ධි නියාමකවරුන් අනිසි ලෙස දේශපාලන කටයුතුවල යොදවන පුද්ගලයන්ට එරෙහිව පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන්ට එරෙහිව පියවර ගැනීම සඳහා නඩු තීන්දුවේ පිටපතක් විගණකාධිපතිවරයාට යොමු කරන ලදි.

මේ නඩු තීන්දුවෙහි පසුබිම බලන විට බලයේ සිටින පක්ෂය සමෘද්ධි නියාමකවරුන් ලවා ඡන්දදායක පුරවැසියන්ට කරන බලපෑම හඳුනාගත හැකි ය. මෙහි දී සිදුවන්නේ ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයන්හට ඡන්දය ප්‍රකාශ නොකළ හොත් සමෘද්ධි සහනාධාරය අහෝසි කරන බව කීම ය. විවිධ පක්ෂවලට අයත් පුරවැසියන්ගේ ඡන්දය දීමේ අයිතිය සමෘද්ධි සහනාධාරය මගින් උල්ලංඝනය කිරීම හා අපක්ෂපාතී ව රාජකාරිය ඉටු කරන්නට ඉඩ නොදීමෙන් පුරවැසියෙකු හැටියට සමෘද්ධි නිලධාරීන්ගේ අයිතිය උල්ලංඝනය කිරීම යන වැරදි දෙක ම එක විට සිදු වේ.

## තොරතුරු දැනගැනීමේ අයිතිය සහ පුරවැසියා

තම නිදහස් මතය දැරීමට එය ප්‍රකාශ කිරීමට මෙන්ම කිසිවකුගේ බාධාවක් නොමැතිව මත දැරීමටත් දේශසීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමටත් පුරවැසියාට ඇති අයිතිය කිසිවකුහට උල්ලංඝනය කළ නොහැකි ය. නිවැරදි තොරතුරු ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම නිරෝගී යහපාලනයක පැවතීම තහවුරු කරනු ඇත.

නිවැරදි තොරතුරු ලැබීමට බාධා කිරීම අසත්‍යය හා මිත්‍යාව තහවුරු කිරීමට හේතුවයි. පුරවැසියා ක්‍රියාකාරී වශයෙන් ආණ්ඩුකරණයේ කොටස්කරුවකු බවට පත්වීමේ ඉඩකඩ එයින් ඇහිරෙයි. තොරතුරු දැනගැනීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙන් ම විවිධ සම්මුතීන් සහ විශේෂ විධිවිධාන මගින් ද තහවුරු කෙරෙයි. ශ්‍රී ලංකාවේ මෑතක දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද තොරතුරු දැගැනීමේ අයිතිය පිළිබඳ පණත් කෙටුම්පත බහුතර ඡන්දයෙන් ප්‍රතික්ෂේප කරන ලදි. මෙහි ප්‍රතිවිපාක, ආණ්ඩු බලය

**නිවැරදි තොරතුරු ලැබීමට බාධා කිරීම අසත්‍යය හා මිත්‍යාව තහවුරු කිරීමට හේතුවයි. පුරවැසියා ක්‍රියාකාරී වශයෙන් ආණ්ඩුකරණයේ කොටස්කරුවකු බවට පත්වීමේ ඉඩකඩ එයින් ඇහිරෙයි.**

**තොරතුරු සම්පාදනයේ දී පුරවැසියාට ඒවා සරලව තේරුම් ගත හැකි ආකාරයෙන් සකස්විය යුතු ය. එමෙන් ම ව්‍යාකූල නොවිය යුතු ය. මහජනයා තම සේවාවන් ලබා දුන් ආයතනවල එම තොරතුරු හොඳින් පෙනෙන සේ ප්‍රදර්ශනය කළයුතු ය.**

ඇත්තන් කෙරෙහි ද අනිසි අයුරින් බලපෑනු වැළැක්විය නොහැකි ය. රාජ්‍ය අංශයේ ආයතනවල ව්‍යූහය වගකීම් සහ කාර්යභාරය පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් පුරවැසියාට අවශ්‍ය වේ.

එම තොරතුරු දැන ගැනීම, අක්‍රමිකතා, දූෂණ හා අල්ලස් වළක්වා ගැනීම සඳහා ද පිටුබලයක් සපයයි. මේ සඳහා රජය මගින් ප්‍රතිපාදන සැපයිය යුතු ය. එනම් රජයේ ආයතන මගින් සලසනු ලබන සේවා, එම සේවා ලබාගන්නා ආකාරය සහ සේවා ලබාදිය යුතු නියමිත කාලය යනාදී තොරතුරු මේ ප්‍රතිපාදනවලට ඇතුළත් ය. සේවාවන් නිසි පරිදි නොලැබෙන අවස්ථාවන්හි දී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයක් පුරවැසියාට ලබාදිය යුතු ය. තොරතුරු සම්පාදනයේ දී පුරවැසියාට ඒවා සරලව තේරුම් ගත හැකි ආකාරයෙන් සකස්විය යුතු ය. එමෙන් ම ව්‍යාකූල නොවිය යුතු ය. මහජනයා තම සේවාවන් ලබා දුන් ආයතනවල එම තොරතුරු හොඳින් පෙනෙන සේ ප්‍රදර්ශනය කළයුතු ය.

## පුරවැසියා දේශපාලන ක්‍රියාකාරීයෙකි.

**දියුණු දේශපාලන සංස්කෘතියක් ඇති රටවල පුරවැසියා දේශපාලනයෙහි සක්‍රිය කොටස් කරුවෙකි.**

දේශපාලනය යන වචනය බොහෝ විට සමීප වන්නේ මැතිවරණයක් අභිමුව ය. මැතිවරණයෙන් පසුව දේශපාලනය ඔහුට අමතක වෙයි. ඉන්පසු එය නොකඩවා භාවිත කරන්නේ දේශපාලකයන් විසිනි. එහෙත් මෙය පසුගාමී දේශපාලන සංස්කෘතියක් පවතින රටවල ලක්ෂණයකි. දියුණු දේශපාලන සංස්කෘතියක් ඇති රටවල පුරවැසියා දේශපාලනයෙහි සක්‍රිය කොටස්කරුවෙකි. ඔහු ජීවත් වනුයේ දේශපාලන කතිකාවක් තුළ ය. මැතිවරණයක දී ඡන්දය පාවිච්චි කිරීමෙන් පසු ව පාලකයන්ට සියලු වගකීම් බාර දී නිහඬ ව තමන්ගේ වැඩක් කරගෙන සිටීමේ පුරුද්දක් එම පුරවැසියන්ට නොමැත.

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 21 (1) වගන්තියෙහි සඳහන් වන අන්දමට කෙළින් ම මෙසේ නිදහස්ව තෝරාගත් නියෝජිතයන් මගින් හෝ තම රටේ රජයට සහභාගි වීමට සැම පුද්ගලයකුට ම සමාන අයිතියක් ඇත.

(3) වන වගන්තියට අනුව රජයේ බලතල පදනම් වන්නේ ජනතාවගේ


**පරමාධිපති බලය ඇත්තේ ජනතාවට ය. ජනතාව ඡන්දය මගින් එම පරමාධිපත්‍ය බලය පාලකයාට ප්‍රදානය කරයි.**

කැමැත්ත මතය. මේ කැමැත්ත ප්‍රකාශ වන්නේ සර්ව ජන ඡන්ද බලය අනුව රහසේ දෙන ඡන්දයෙන් හෝ ඊට සමාන ස්වාධීන ඡන්ද විමසීමේ ක්‍රම මගින් කලින් කලට අව්‍යාජ ලෙසින් පවත්වන ඡන්ද විමසීම් මගිනි.

පරමාධිපති බලය ඇත්තේ ජනතාවට ය. ජනතාව ඡන්දය මගින් එම පරමාධිපත්‍ය බලය පාලකයාට ප්‍රදානය කරයි. පාලකයා එය ක්‍රියාත්මක කරයි. එහි දී එම බලය ජනතාවට සතුරු අන්දමින් ක්‍රියාත්මක කරයි නම් එම බලය ඔහුට හෝ ඇයට අහිමි කිරීමේ බලගතු ශක්තිය ඇත්තේ ජනතාවටම ය. ඒ අනුව තම ඡන්දය පාවිච්චි කිරීමෙන් පසු ව පාලකයාට ඕනෑම තීන්දුවක් ගන්නට ඉඩ දී නිහඬ ව සිටීම පුරවැසියාගේ කාර්යය නොවේ. ඔහු දේශපාලනයේ දැනුවත් කොටස්කරුවෙකි. තමන්ට විරුද්ධ ව පාලකයා විසින් පාවිච්චි කරනු ලබන බලය ප්‍රදානය කර ඇත්තේ තම ඡන්ද අයිතිය මගින් බව තේරුම් ගැනීම පුරවැසියාට වැදගත් වේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වැනි ව්‍යවස්ථාවේ ජනතාව සතු පරමාධිපත්‍ය මෙසේ පැහැදිලි කරයි.

ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය අන්සතු කළ නො හැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය.



ප්‍රථම විධායක ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන

පරමාධිපතිබලය ක්‍රියාත්මක වන ආකාරය 4 වැනි ව්‍යවස්ථාව මෙසේ පහදයි.

(ආ) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත් කරගනු ලබන මන්ත්‍රීවරු සමන්විත පාර්ලිමේන්තුව විසින් ද ජනමත විචාරණයක දී ජනතාව විසින් ද ක්‍රියාත්මක කළ හැක්කේ ය.

(ආ) රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.



වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ

ව්‍යවස්ථාවේ මෙසේ දක්වුව ද විධායක බලය ක්‍රියාත්මක වීම අනුව බලය ද්විත්ව කරණය වීම නිසා ජනතාවගේ පරමාධිපති බලය කොටස් කර ඇත යන්න ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතාගේ අදහසයි.



ආචාර්ය
ඇන්. ඇම්. පෙරේරා

**විධායක බලය ක්‍රියාත්මක වීම අනුව බලය ද්විත්ව කරණය වීම නිසා ජනතාවගේ පරමාධිපති බලය කොටස් කර ඇත යන්න ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතාගේ අදහසයි.**

පුරවැසියා දේශපාලනයෙහි ක්‍රියාකාරී කොටස්කරුවකු වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි ඇත්තේ පසුගාමී ආකල්පයකි. පුරවැසියන්ගේ බහුතරය පරමාධිපති බලය දේශපාලකයා සතු ය යන ආකල්පයෙන් කටයුතු කරනු පෙනේ.

මේ නිසා ජනතා මර්දනයට ද, දූෂණය හා වංචාවට ද පාලකයාට මග සැලසේ. උදාහරණයක් වශයෙන් 2013 වසරෙහි ශ්‍රී ලංකාවේ අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක සේවයෙන් ඉවත් කිරීමේ සිදුවීම ගත හැකි ය.

ඒ මෙසේ ය. ආණ්ඩුව අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය නැංවීමෙහි ලා ඉදිරිපත් කරන ලද දිවිනැගුම පණත පාර්ලිමේන්තුවට සකස් කළේ ය. එහෙත් දිවි නැගුම පණතට අදාළ විෂයයන් බොහොමයක් පළාත් සභා විෂයයට ගැනෙන හෙයින් මේ පිළිබඳ අර්ථ නිරූපණයක් ඉල්ලා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු පුරවැසියන් ගණනාවක් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කළහ. අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායකගේ ප්‍රමුඛත්වයෙන් යුත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල

මේ පණත සියලු පළාත් සභාවලින් සම්මත කොට පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු බවට තීන්දුව දුන්නේ ය. මේ තීන්දුවට හිස නොනැමූ ආණ්ඩුව ඇයට සාවද්‍ය චෝදනා ඉදිරිපත් කළේ ය. මීට විරුද්ධ ව ක්‍රියාකාරීව කටයුතු කළේ ඉතා සුළු පිරිසකි. මෙහි දී කරුණු දෙකක් නිරීක්ෂණය කළ හැකි විය.

**දිවි නැගුම පණතට අදාළ විෂයයන් බොහොමයක් පළාත් සභා විෂයයට ගැනෙන හෙයින් මේ පිළිබඳ අර්ථ නිරූපණයක් ඉල්ලා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු පුරවැසියන් ගණනාවක් ශ්‍රේෂ්ඨාධි කරණයට පෙත්සම් ඉදිරිපත් කළහ.**

ඉන් පළමුවැන්න අධිකරණ විෂය පාලකයන් සතු බවට හා මහජනයාට එය වැදගත් වන්නේ නඩු ඇසීමේ දී පමණක් බවට ආකල්පයක් සමාජයෙහි වෙලී පැතිර ඇති බව ය. මෙහි දී ජනපිරිස් ලෙස අධිකරණ භූමියට රැස්වූයේ අගවිනිසුරුවරියට එරෙහි වීම සඳහා පාලකයන් විසින් ගෙන්වන ලද ලුම්පන් කණ්ඩායමකි. අගවිනිසුරු ඉවත් කිරීමේ ක්‍රියාදාමයට එරෙහි ව රොක් වූ පිරිස මැර ප්‍රහාරයට ද ලක් විය.

මේ අත්තනෝමතික ක්‍රියාදාමය විශාල ජන කැළඹීමකට තුඩු දුන්නේ නැත. ශිරාණි බණ්ඩාරනායක නීත්‍යානුකූලව ඉවත් නොකළ හෙයින් ඇය තවමත් අගවිනිසුරු වුව ද ඇය පිළිබඳ කතිකාවක් පුරවැසි සමාජයෙහි නිර්මාණය වී නොමැත.

**නිරීක්‍ෂණය කළ හැකි අනෙක් වැදගත් කරුණ නම්, අධිකරණය විෂයහි ජනතා සහභාගිත්වය ව්‍යවස්ථාවෙන් තහවුරු කර තිබිය දී පුරවැසියන් ඒ පිළිබඳ නිද්‍රාශීලී වීම ය.**

නිරීක්‍ෂණය කළ හැකි අනෙක් වැදගත් කරුණ නම්, අධිකරණය විෂයහි ජනතා සහභාගිත්වය ව්‍යවස්ථාවෙන් තහවුරු කර තිබිය දී පුරවැසියන් ඒ පිළිබඳ නිද්‍රාශීලී වීම ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (අ) වගන්තිය මෙසේ ය.

*"නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාරණ හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියක් ඇති කොට පිහිටුවන ලද අධිකරණ විනිශ්චය අධිකාර සහ ආයතන මගින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය."*

මෙහි ඇති පරිදි 'ජනතාවගේ අධිකරණ බලය' ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද ආයතන ව්‍යුහයක් මගින් ක්‍රියාත්මක වේ. ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත්තේ පුරවැසියාගේ ඡන්දයෙන්

පත් වූ නියෝජනයන් ගෙන් සමන්විත ව්‍යවස්ථාදායකය විසිනි. එහෙත් ජනතාව සතු පරමාධිපති බලය ද්විත්වකරණය හේතුවෙන් විධායකය අධිකරණයෙන් පාලනය කිරීමේ අගතිය ක්‍රියාත්මක වී පුරවැසියා අවලංගු කාසියක් බවට පත් විය. මෙහි දී පුරවැසියා සතු වගකීම වන්නේ ජනතා පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා තෙරපුමක් ඇති කිරීම ය. නො එසේ නම් එය ක්‍රියාත්මක කළ හැකි මහජන නියෝජනයක් පත් කර ගැනීම ය.

**ජනතාව සතු පරමාධිපත්‍යය බලය ද්විත්වකරණය හේතුවෙන් විධායකය අධිකරණයෙන් පාලනය කිරීමේ අගතිය ක්‍රියාත්මක වී පුරවැසියා අවලංගු කාසියක් බවට පත් විය.**

පුරවැසියා දේශපාලන ක්‍රියාකාරිකයකු වීමේ යහපත් ප්‍රතිඵල අත්පත් කරගත් අවස්ථාවක් මෙහි දී ගෙන හැර දැක්විය හැකි ය.

එප්පාවල පොස්පේට් නිධිය, ඇමරිකාවේ මැක්මොරන් සමාගමට පැවරීම සඳහා රජය එම සමාගම සමග ගිවිසුමක් අත්සන් කළේ ය. රජයේ පාර්ශ්වයෙන් මේ ගිවිසුම සඳහා නීතිපතිවරයා ද අත්සන් තැබී ය. මේ ගිවිසුම ක්‍රියාත්මක වීම නිසා සිදුවන හානියට එරෙහි උතුරු මැද පළාත කේන්ද්‍ර කරගනිමින් විශාල ජන අරගලයක්

**එප්පාවල පොස්පේට් නිධිය, ඇමරිකාවේ මැක්මොරන් සමාගමට පැවරීම සඳහා රජය එම සමාගම සමග ගිවිසුමක් අත්සන් කළේ ය. රජයේ පාර්ශ්වයෙන් මේ ගිවිසුම සඳහා නීතිපතිවරයා ද අත්සන් තැබී ය.**

දියත් කෙරුණි. මහමාන්කඩවල පියරතන හිමියන්ගේ නායකත්වයෙන් හා සිවිල් ක්‍රියාකාරිකයන් රැසකගේ දායකත්වයෙන් මෙය ක්‍රියාත්මක විය.

විවිධ තර්ජන ගර්ජන අවලාද මැද ජන අරගලය පණ පෙවිණ. ඒ අතරතුර ගිවිසුම නිසා අගතියට පත් වන භූමියෙහි පුරවැසියන් පස් දෙනකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලැබී ය. පෙත්සම විභාගයට ගනිමින් ඓතිහාසික තීන්දුවක් ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණය එම පුද්ගලයන්ගේ මූලික අයිතීන් කඩ වී ඇති බව පිළිග නිමින් ඔවුන් හට වන්දි ගෙවීමට වග උත්තරකරුවන්ට නියෝග කළේ ය. එමෙන් ම ගිවිසුම බල රහිත කර, ජාතික විද්‍යා පදනමේ නිර්දේශ ද සැලකිල්ලට ගනිමින් පොස්පේට් නිධිය පිළිබඳ පූර්ණ ගවේෂණයක් සිදුකර දේශීය පොහොර අවශ්‍යතා සපුරාලන පරිදි හා පරිසර සංහාරයක් නොවන පරිදි නිධිය භාවිතයට ගැනීම සඳහා නිර්දේශ නිකුත් කළේ ය.

මේ නඩුව විභාග කරන ලද්දේ ආචාර්ය ඒ. ආර්. බී. අමරසිංහ හා

මාර්ක් ප්‍රනාන්දු ප්‍රමුඛ කීර්තිමත් විනිසුරු මඬුල්ලක් විසිනි.

## පුරවැසියාගේ සහභාගිත්ව ප්‍රවේශය

ආර්ථික සංවර්ධනය, පරිපාලනය, සෞඛ්‍ය යනාදී ක්ෂේත්‍ර ගණනාවක ප්‍රගතියට හේතු වන බවට අත්දැකීම් රැසක් සමාජයෙහි පවතී. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය සුබසාධන වැඩසටහන් අතර ජනසවිය සහ සමෘද්ධිය ව්‍යාපාරය පුළුල් ජන පිරිසක් නියෝජනය කළේ ය. ජනසවිය ව්‍යාපාරය යටතේ බිම් මට්ටමේ කුඩා කණ්ඩායම්වල ඉතුරුම් පදනම් කරගෙන බිහි වූ ජනශක්ති බැංකුව හම්බන්තොට ප්‍රදේශයෙහි සාර්ථක අයුරින් ක්‍රියාත්මක විය. බැංකුව සාර්ථක ව ක්‍රියාත්මක වන අවධියෙහි මූල්‍ය කළමනාකරණයෙහි ඇතැම් ගැටලු පැන නගින්නට වූයේ විගණන දැනුම බැංකුවෙහි ක්‍රියාකාරිකයන්ට නොමැති වීම හේතුවෙනි. මෙහි දී ඔවුන් හට විගණන දැනුමක් ලබා දීමට කටයුතු යෙදිණි. ආණ්ඩු පාලනය වෙනස් වී ජන සවිය වැඩසටහන වෙනුවට වෙනත් සුබසාධන වැඩසටහන් දියත් කෙරුණ ද ජනශක්ති බැංකුව ඉහළ සිට පහළට

**ආර්ථික සංවර්ධනය, පරිපාලනය, සෞඛ්‍ය යනාදී ක්ෂේත්‍ර ගණනාවක ප්‍රගතියට හේතු වන බවට අත්දැකීම් රැසක් සමාජයෙහි පවතී.**

**ජනශක්ති බැංකුව ඉහළ සිට පහළට ක්‍රියාත්මක වන මෙහෙයුමකින් තොරව ස්වාධීනව ඉදිරියට ගියේ ය. මෙහි දී සිදුවූයේ පුරවැසි සහභාගිත්වය ප්‍රශස්ත මට්ටමක පැවතීම ය.**

ක්‍රියාත්මක වන මෙහෙයුමකින් තොරව ස්වාධීනව ඉදිරියට ගියේ ය. මෙහි දී සිදුවූයේ පුරවැසි සහභාගිත්වය ප්‍රශස්ත මට්ටමක පැවතීම ය. එමෙන්ම සණස ව්‍යාපාරය ද ජන සහභාගිත්වයක් සහිත ක්‍රියාකාරී ආයතනයක් ලෙස කැපී පෙනේ.

බදු එකතු කිරීමේ ක්‍රියාවලිය මහජන සහභාගිත්වයෙන් සක්‍රිය කිරීම නිසා ස්වශක්තියෙන් කටයුතු කිරීමේ හැකියාව ලැබුණු ප්‍රාදේශීය සභාවන් හා නගර සභා සුළු සංඛ්‍යාවක් අතරින් වාරියපොළ ප්‍රාදේශීය සභාව ග්‍රාමීය පරිසරයක පිහිටි ප්‍රාදේශීය සභාවක් වශයෙන් ජන සහභාගිත්වයෙන් කිසියම් වෙනසක් කළ පළාත් පාලන ආයතනයක් ලෙස හැඳින්විය හැකි ය.

2005 වර්ෂය වන විට මහජන නියෝජිතයන් 21 දෙනෙකුගෙන් සමන්විත වූ එම ප්‍රාදේශීය සභාව හිඟ බදු මුදල් අයකර ගැනීම දුර්වල මට්ටමක පැවති හෙයින් මූල්‍ය අර්බුදයකට ගෙදුරු වී සිටියේ ය. එහි දී ආසියාතික පදනම අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර නගර/ගම් කළමනාකරණ උපදේශක ආයතනය වාරියපොළ



ප්‍රාදේශීය සභාවට උපදේශාත්මක සේවාවක් සැපයීමට ඉදිරිපත් විය.

මෙහි දී බදු මුදල් ගෙවීමේ අදාළත්වය පිළිබඳව ප්‍රාදේශීය සභාව හා මහජනයා අතර සම්බන්ධතාවය පිළිබඳ දැනුවත් කිරීමක් සිදුවිය. බදු මුදල් නොගෙවීමේ අහිසි විපාක මහජනයාට බලපාන ආකාරය පිළිබඳ මනා අවබෝධයක් ලබා දෙමින් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරන ලදි.

"බදු එක්රැස් කිරීමේ සතියක්" ක්‍රියාත්මක කිරීම එහි එක් පියවරකි. බදු අයකිරීම පැහැර හරින්නන්ගේ නම් අදාළ බල ප්‍රදේශයෙහි දැන්වීම් පුවරු මගින් ප්‍රසිද්ධ කිරීමට ද මහජන අනුමැතිය ලැබිණි. එමෙන් ම ප්‍රාදේශීය සභාව මගින් නව අය බදු ප්‍රතිපත්තියක් ද හඳුන්වා දෙන ලදි.

මෙහි ප්‍රතිඵලය වූයේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පෙර එකතු වූ බදු මුදල් ප්‍රමාණය මෙන් තෙගුණයක් බදු මුදල් ප්‍රමාණයක් එක් කර ගැනීමේ හැකියාව ප්‍රාදේශීය සභාවට ලැබීම ය. මේ නිසා, ප්‍රාදේශීය සභාවේ කටයුතු වලින් 80% ක් ම බදු මුදල් මගින් ඉෂ්ට කර ගැනීමේ හැකියාව ලැබිණි.

**පුරවැසියාගේ ආකල්පවල යහපත් වෙනසක් ඇති වීම හා ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ද කාර්ය මණ්ඩලයේ ප්‍රබෝධය උනන්දුව ද මෙහිදී වැදගත් විය.**

පුරවැසියාගේ ආකල්පවල යහපත් වෙනසක් ඇති වීම හා ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ද කාර්ය මණ්ඩලයේ ප්‍රබෝධය උනන්දුව ද මෙහිදී වැදගත් විය.

මෙකී පුරවැසි සහභාගිත්ව ප්‍රවේශය, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට වඩා ප්‍රායෝගික විය.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව පොලිස් නිලධාරීන් ද ඇතුළුව රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම හා ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත.

සාධාරණ හා විනිවිද භාවයකින් කෙරෙන කාර්යක්ෂම විනයගරුක, රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම මෙහි අරමුණ වේ. ශ්‍රී ලංකවේ මුල්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිහිටුවන ලද්දේ 1946 දී ය. දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොර නිදහස් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම ඉන් අපේක්ෂා කළ ද කල් යෑමේ දී මේ තත්ත්වය වෙනස් විය. එහි කුටප්‍රාප්තිය වූයේ 1972 ජනරජ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමේ දී ස්වාධීන ආයතනයක් හැටියට තිබූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ

**සාධාරණ හා විනිවිද භාවයකින් කෙරෙන කාර්යක්ෂම විනයගරුක, රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම මෙහි අරමුණ වේ. ශ්‍රී ලංකාවේ මුල්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිහිටුවන ලද්දේ 1946 දී ය.**

**රජයට හිලෑ නොවන විවිධ මත දරන රාජ්‍ය සේවකයන් ස්ථාන මාරුවීම්, උසස් වීම් ප්‍රමාද කිරීම්, වැඩ තහනමට ලක් කිරීම් හෝ විවිධ අයුරින් අඩන්තේට්ටම් වලට ලක් කිරීම් යනාදී හේතු මත එම අවශ්‍යතාවය බලවත් ව නැඟී තිබුණි.**

අධිකාරී බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා දෙනු ලැබීම ය.

නිදහසේ රාජ්‍ය සේවයක අවශ්‍යතාව පිළිබඳ සංවාදය දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණි රජයට හිලෑ නොවන විවිධ මත දරන රාජ්‍ය සේවකයන් ස්ථාන මාරුවීම්, උසස් වීම් ප්‍රමාද කිරීම්, වැඩ තහනමට ලක් කිරීම් හෝ විවිධ අයුරින් අඩන්තේට්ටම්වලට ලක් කිරීම් යනාදී හේතු මත එම අවශ්‍යතාවය බලවත් ව නැඟී තිබුණි.

මේ සම්බන්ධයෙන් රටේ විද්වත් පාර්ශ්ව හා ජනමාධ්‍යවේදීන්ගේ දායකත්වයෙන් යෝජනා ද ඉදිරිපත් විය. නිදහස් රාජ්‍ය සේවයක් සඳහා වැදගත් වන මූලධර්ම සහ ක්‍රියාමාර්ග ඇතැම් පාර්ශ්ව විසින් කෙටුම්පත් කරනු ලැබීම මෙහි ප්‍රතිඵලයකි. කෙසේ හෝ ඉතා දුෂ්කර වෑයමකින් පසු ව 2001 දී 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය තුළින් රාජ්‍ය සේවය පිළිබඳ ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති ix වන පරිච්ඡේදය පරිච්ඡින්න කොට නව පරිච්ඡේදයක් ඇතුළත් කරන ලදි.

මේ සංශෝධනයට අනුව කොමිෂන් සභාවේ සමාජික සංඛ්‍යාව 9 කි.

ව්‍යවස්ථා සභාවේ නිර්දේශ අනුව ජනාධිපතිවරයා සාමාජිකයන් පත්කරනු ලබයි. සාමාජිකයන් නව දෙනා අතරින් ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත සභාපතිවරයා පත්කරනු ලබන්නේ ද ජනාධිපති විසිනි.

මෙය ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ රාජ්‍ය සේවයේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු සහ විනය පාලනය පිළිබඳ පූර්ණ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලැබීම හේතුවෙනි.

**ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ රාජ්‍ය සේවයේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු සහ විනය පාලනය පිළිබඳ පූර්ණ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලැබීම හේතුවෙනි.**

මෙහි දී මෙම කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත් කෙරිණ.

17 වැනි ව්‍යවස්ථා සංශෝධන යෝජනාව පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීම සඳහා පැවති ඡන්දයේ දී ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලු මහජන නියෝජනයන් ඊට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම විශේෂත්වයකි. මෙය රටේ දේශපාලන සංස්කෘතිය නව දිශානතියකට යොමු කිරීමේ අවස්ථාවක් බවට පත් විය.

**ඒ අනුව 17 වැනි සංශෝධනය මගින් නිදහස් රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම උදෙසා ගනු ලැබූ ඉතා වැදගත් උත්සාහය 18 වැනි සංශෝධනය මගින් නිෂේධනය කරන ලදි.**

එහෙත් එය නිරෝගී ව ක්‍රියාත්මක වීමට බාධා එල්ල වූයේ කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීමේ ක්‍රියාවලියේ පටන් ය.

2010 වසරේ දී 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් කොමිෂන් සභාවේ ස්ථාපනය හා කර්තව්‍යයන්ට අදාළ කරුණු සංශෝධනය කරන ලදි.

17 ව්‍යවස්ථාව සංශෝධනයට අනුව කොමිෂන් සභාවේ සාමාජිකයන් ව්‍යවස්ථා සභාව මගින් යෝජනා කිරීම වෙනුවට 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 54 (1) ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 9 දෙනෙකුගෙන් කොමිෂන් සභාව සෑදෙයි. ජනාධිපතිවරයා විසින් එම 9 දෙනා අතුරින් සභාපතිවරයා පත් කරනු ලබයි.

55 (1) අනුව අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ නිලධාරීන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

ඒ අනුව 17 වැනි සංශෝධනය මගින් නිදහස් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම උදෙසා ගනු ලැබූ ඉතා වැදගත් උත්සාහය 18 වැනි සංශෝධනය මගින් නිෂේධනය කරන ලදි.

## ජාතික පොලිස් කොමිෂන් සභාව

පොලිස් නිලධාරීන්ට එරෙහි ව ඇති මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ බලය ජාතික පොලිස් කොමිෂන් සභාවට පැවරේ. නීතියේ ආධිපත්‍යයට ගරු කිරීමේ හා මහජනතාවට වගවීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක කෙරේ.

**පොලිස් නිලධාරීන්ට එරෙහි ව ඇති මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ බලය ජාතික පොලිස් කොමිෂන් සභාවට පැවරේ. නීතියේ ආධිපත්‍යයට ගරු කිරීමේ හා මහජනතාවට වගවීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක කෙරේ.**

18 වැනි ව්‍යවස්ථා සංශෝධනය අනුව ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයන් පත් කරයි. 18 වන සංශෝධනයේ 155 ඊ ව්‍යවස්ථාව අනුව යම් පුද්ගලයකුගෙන් පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් සේවයට එරෙහිව ලැබෙන පැමිණිලි බාර ගැනීම, විමර්ශනය කිරීම සහ පාර්ලිමේන්තුව මගින් බලාත්මක කරන ලද යම් නීතියකට අනුකූල සහන සලස්වා දීමට කොමිසමට බලය ඇත.

එහෙත් 17 වැනි සංශෝධනයට අනුව පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන් පත්කිරීම ජනාධිපති

**එහෙත් 17 වැනි සංශෝධනයට අනුව පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන් පත්කිරීම ජනාධිපති විසින් කළ යුත්තේ ව්‍යවස්ථා සභාවේ නිර්දේශවලට අනුව ය.**

විසින් කළ යුත්තේ ව්‍යවස්ථා සභාවේ නිර්දේශවලට අනුව ය. 17 වැනි සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිසම පිහිටුවීමෙන් අපේක්ෂා කරන ලද්දේ දේශපාලන ඇඟිලිගැසීම් වලින් තොර වූ ස්වාධීන රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම ය. ව්‍යවස්ථා සභාව මගින් කොමිසමේ සාමාජීයකයන් නිර්දේශ කිරීමෙන් බලාපොරොත්තු වූයේ එයයි. දේශපාලන බලපෑම්වලට යටවීම, පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ දී අසීමාන්තික ව බලය පාවිච්චි කිරීම සැකකරුවන් අත්අඩංගුවට ගැනීමේ දී හිරිහැරවලට ලක් වීම සහ මිය යාම සහ අල්ලස් ගැනීම යනා දී වශයෙන් දීර්ඝ කාලයක් තිස්සේ පොලිස් දෙපාර්තමේන්තුවට චෝදනා එල්ල වී තිබූ තත්ත්වයක් යටතේ 17 වැනි සංශෝධනය මගින් ස්වාධීන පොලිස් සේවයක් ස්ථාපිත කිරීම පිළිබඳ බලාපොරොත්තු ඇති විය.

එහෙත් 18 වැනි සංශෝධනය මගින් එම බලාපොරොත්තු සුන් විය.

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටකි. එහෙයින් ශ්‍රී ලංකාව විසින් බොහෝ ජාත්‍යන්තර සම්මුතීන්ට අත්සන් තබා ඇත. ඒ අනුව කටයුතු කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටී.



**1996 පණත් අංක 21 මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවන ලදි. මෙය ස්වාධීන ආයතනයකි.**

ඒ අනුව 1996 අංක 21 පණත මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවන ලදි. මෙය ස්වාධීන ආයතනයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා ජාතික නීති පද්ධතියේ ජාත්‍යන්තර සම්මුතිවලට අනුකූල ලෙස සාකච්ඡා කිරීම සඳහා රජයට මග පෙන්වීම එහි කාර්යභාරයන් ය.

එමෙන් ම මානව හිමිකම් පිළිබඳ දැනුම පුරවැසියන් අතර ප්‍රචලිත කිරීම ද එහි වගකීමකි.

**මානව හිමිකම් කොමිෂන් සභාව රජයට අභියෝග යක් නොවන හීලෑ ආයතනයක් යැයි මහජනයා අතර පවතින අවිශ්වාසය.**

කොමිෂන් සභාවේ සාමාජිකයන් ගණන 5 කි මානව හිමිකම් විෂය සම්බන්ධයෙන් දැනුම හා පලපුරුද්ද ඇති අය අතරින් සාමාජිකයන් තෝරා ගැනේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් මේ පත්වීම් කරනු ලැබේ. සාමාජිකයන් අතරින් සභාපතිවරයකු නම් කිරීම ද ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලබයි. සාමාන්‍යයෙන් ධුර කාලය වසර 3 කි.

මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මහජනයා අතර එතරම් ප්‍රසාදයක් ඇති නොවී ය. ඊට හේතු කිහිපයකි.

1. ඉදිරිපත් කරනු ලබන පැමිණිලි විභාග කිරීම ප්‍රමාද වීම. ඇතැම් පැමිණිලි සම්බන්ධයෙන් කිසිම පරීක්ෂණයක් නොපැවැත්වීම.

2. මානව හිමිකම් කොමිෂන් සභාව රජයට අභියෝගයක් නොවන හීලෑ ආයතනයක් යැයි මහජනයා අතර පවතින අවිශ්වාසය.

3. කොමිෂන් සභාවේ වගකීම් සහ කාර්යභාරයන් නිසි පරිදි ඉෂ්ට වන බවක් පෙනෙන්නට නොතිබීම.

## ඔම්බුඩ්ස්මන්

පුරවැසියන්ගේ දුක්ගැනවිලි වලට සහන සැලසීම සඳහා 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙනු ලැබූ යාන්ත්‍රණ දෙකෙන් එකක් වනුයේ පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) තනතුරයි. අනෙක් යාන්ත්‍රණය ශ්‍රේෂ්ඨාධිකරණය මගින් මූලික අයිතිවාසිකම් නඩු විභාග කිරීමේ බලයයි.

ඔම්බුඩ්ස්මන් යනු අපක්ෂපාතී පරීක්ෂකයෙකි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 (1) වගන්තිය මෙසේ දැක් වේ.

*"පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ධුරය ඇති කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය. රජයේ නිලධාරින් විසින් රාජ්‍ය සංස්ථාවල, පළාත් පාලන ආයතනවල හා එවැනි වෙනත් ආයතනවල නිලධරයන් විසින්*

**පුරවැසියන්ගේ දුක්ගැනවිලි වලට සහන සැලසීම සඳහා 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙනු ලැබූ යාන්ත්‍රණ දෙකෙන් එකක් වනුයේ පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) තනතුරයි.**

*සිදු කරනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සහ වෙනත් අසාධාරණ ක්‍රියා ගැන කරනු ලබන පැමිණිලි හෝ චෝදනා ඒ නීතියේ විධි විධානවලට අනුකූලව හා යටත්ව පරීක්ෂා කර බලා වාර්තා කිරීමේ කාර්ය භාරය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත පැවරෙන්නේ ය.”*

ඔම්බුඩ්ස්මන්වරයා තමන්ට ලැබෙන තොරතුරු සම්බන්ධයෙන් රහස්‍ය භාවය රැකිය යුතු ය. ඔහුගේ වගකීම වනුයේ මූලික අයිතිවාසිකම් කඩවීම් හා වෙනත් අසාධාරණකම් පිළිබඳ පැමිණිලි හෝ චෝදනා පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීම යනුවෙන් හැඳින් වේ.

එහෙත් ඔම්බුඩ්ස්මන්වරයාට අධිකරණ බලතල නොමැත. එනිසා රජයේ සේවකයන්ගේ පත්වීම්, මාරුවීම් හා විනයානුකූල පාලනයට අදාළ පැමිණිලි පිළිබඳව ඔහුට විභාග කළ නොහැක.

ඊට හේතුව වන්නේ 1981 පනතේ 11 (ආ) වගන්තියෙන් ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල සීමා කර තිබීම ය. ඔම්බුඩ්ස්මන්වරයාට

**ඔම්බුඩ්ස්මන් වරයා තමන්ට ලැබෙන තොරතුරු සම්බන්ධයෙන් රහස්‍ය භාවය රැකිය යුතු ය. ඔහුගේ වගකීම වනුයේ මූලික අයිතිවාසිකම් කඩවීම් හා වෙනත් අසාධාරණකම් පිළිබඳ පැමිණිලි හෝ චෝදනා පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීම යනුවෙන් හැඳින් වේ.**

කෙළින් ම පැමිණිලි ඉදිරිපත් කළ නොහැක. මන්ත්‍රීවරයකු මාර්ගයෙන් එය කළ හැක්කේ ය. මහජනයාට ඔම්බුඩ්ස්මන්වරයා වෙත කෙළින් ම ඉදිරිපත් වීමට නොහැකි වීම අඩුපාඩුවකි. එහෙත් ඇතැම් රටවල ඔම්බුඩ්ස්මන් තනතුර ස්ථාපිත කොට ඇත්තේ කෙළින් ම මහජනයාට සම්මුඛ විය හැකි පරිද්දෙනි.

එහෙත් 1994 සංශෝධනය මගින් ඔම්බුඩ්ස්මන්වරයාට පැමිණිලි ඉදිරිපත් කිරීමේ ක්‍රියා මාර්ගය ලිහිල් කර තිබේ. ඊට පෙර ඔම්බුඩ්ස්මන්වරයාට හැකි වූයේ පෙත්සම්කාරක සභාවට තමන්ගේ නිගමනයන් හා එම නිගමනයට හේතු වාර්තා කිරීමත් සඳහා එය නිර්දේශ ඉදිරිපත් කිරීම පමණි. එය සලකා බැලීමෙන් පසුව ගත යුතු පියවර සම්බන්ධයෙන් තම අදහස් පෙත්සම් කාරක සභාවට/පාර්ලිමේතුවට වාර්තා කළ හැක.

1994 සංශෝධනය අනුව ඔම්බුඩ්ස්මන්වරයාට තම නිගමනය හා නිගමනයට එළැඹීමේ හේතු අදාළ ආයතනයේ ප්‍රධානියාටත් ඒ ආයතනය අයත් වන අමාත්‍යවරයාටත් මහජන පෙත්සම්කාරක සභාවටත් වාර්තා කිරීමට බලතල ලබා දී ඇත.

**ඊට හේතුව වන්නේ 1981 පනතේ 11 (ආ) වගන්තියෙන් ඔම්බුඩ්ස්මන් වරයාගේ බලතල සීමා කර තිබීම ය. ඔම්බුඩ්ස්මන් වරයාට කෙළින් ම පැමිණිලි ඉදිරිපත් කළ නොහැක. මන්ත්‍රීවරයකු මාර්ගයෙන් එය කළ හැක්කේ ය.**

**1994 සංශෝධනය අනුව ඔම්බුඩ්ස්මන් වරයාට තම නිගමනය හා නිගමනයට එළැඹීමේ හේතු අදාළ ආයතනයේ ප්‍රධානියාටත් ඒ ආයතනය අයත් වන අමාත්‍යවරයාටත් මහජන පෙත්සම්කාරක සභාවටත් වාර්තා කිරීමට බලතල ලබා දී ඇත.**

යම් කාලසීමාවක් තුළ සුදුසු පියවරක් ගෙන නැතිනම් අදාළ ආයතන ප්‍රධානියා විසින් ඒ පිළිබඳ කවර හෝ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත්නම් ඒ නිරීක්ෂණ ජනාධිපතිවරයාටත් පාර්ලිමේන්තුවටත් වාර්තා කළ යුතු ය.

ඔම්බුඩ්ස්මන්වරයා ඉදිරිපත් කළ වාර්තාවක් සම්බන්ධයෙන් ඔහු අධිකරණයට කැඳවිය නොහැක. ඔහුට විරුද්ධ ව නඩු පැවරිය නොහැක.

## අඩුපාඩු

1. ඔම්බුඩ්ස්මන්වරයාගේ බලපෑම අඩුවීම.
2. රාජ්‍ය ආයතන සහ නිලධාරීන් සැලකිය යුතු කොටසක් ඔම්බුඩ්ස්මන්වරයාගේ විෂය පථයෙන් නිදහස් වීම.

උදා - අමාත්‍යවරුන්, අධිකරණ නිලධාරීන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් පාර්ලිමේන්තු මහලේකම්වරයා හා කාර්යමණ්ඩලය.

3. ප්‍රමාණවත් සම්පත් නොමැතිකම.
4. ඔම්බුඩ්ස්මන්වරයා වෙත කෙළින් ම ප්‍රවේශ වීමේ හැකියාව නොමැතිකම.

## පාර්ලිමේන්තු කාරක සභා

ව්‍යවස්ථාදායකයට පැවරී ඇති බර සැහැල්ලු කිරීමේ උපාය මාර්ගයක් හැටියට කාරක සභා පිහිටුවීම හැඳින්විය හැකි ය. කාරක සභා පිහිටුවීමේ බලය ආණ්ඩුක්‍රම 74 ව්‍යවස්ථාවෙන් පිළිගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කාරක සභා, දායක වේ යැයි අපේක්ෂිත ය.

පොදු රීති මාලාවක් යටතේ ක්‍රියාත්මක වන කාරක සභා නවයක් පාර්ලිමේන්තුවෙහි ක්‍රියාත්මක වේ. මහජන පෙත්සම් කාරක සභාව එයින් එකකි.

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 128 යටතේ ඔම්බුඩ්ස්මන්වරයාට පැමිණිලි යොමු කිරීමේ පරමාර්ථය ඇති ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දස දෙනකුගේ නියෝජනයෙන් මහජන

**පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 128 යටතේ ඔම්බුඩ්ස්මන් වරයාට පැමිණිලි යොමු කිරීමේ පරමාර්ථය ඇති ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දස දෙනකුගේ නියෝජනයෙන් මහජන පෙත්සම් කාරක සභාවක් පිහිටුවන ලදි.**

**කාරක සභාවේ සභාපතිවරයා තොරාගනු ලබන්නේ එහි සාමාජික මන්ත්‍රීවරුන් කණ්ඩායම අතුරෙනි. කාරක සභාවේ ක්‍රියාකාරීත්වය තීන්දු වන්නේ සහ සඵල වන්නේ සභාපතිවරයාගේ පෞරුෂය, කැපවීම සහ උනන්දුව මත ය.**

පෙත්සම් කාරක සභාවක් පිහිටුවන ලදි.

පෙත්සමක් ඉදිරිපත් කිරීමේ දී සපුරාලිය යුතු කොන්දේසි 25 අ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගයෙහි දක් වේ.

1981 දී මේ පණත සංශෝධනය කර ඇත්තේ රජය විසින් මහජන පෙත්සම් කථානායක වරයාට ගොනු කළ හැකි වන පරිදි ය.

1981 පණතට අනුව මහජන පෙත්සම් සම්බන්ධයෙන් තම නිගමන හා සහන සැලසීමේ නිර්දේශ ඉදිරිපත් කරනුයේ මහජන පෙත්සම් කාරක සභාවට ය.

1994 සංශෝධන අනුව එම නිගමන හා නිර්දේශ මහජන පෙත්සම් කාරක සභාවට අමතර ව අදාළ ආයතන ප්‍රධානියාට හා ඇමතිවරයාට ද යොමු කෙරේ.

ඒ අනුව සහන සැලසීම සඳහා 1994 වන තෙක් ම මහජන පෙත්සම් කාරක සභාවට තිබූ අභිමතය වෙනස් විය.

කාරක සභාවේ සභාපතිවරයා තොරාගනු ලබන්නේ එහි සාමාජික මන්ත්‍රීවරුන් කණ්ඩායම අතුරෙනි.



කාරක සභාවේ ක්‍රියාකාරිත්වය තීන්දු වන්නේ සහ සඵල වන්නේ සභාපතිවරයාගේ පෞරුෂය, කැපවීම සහ උනන්දුව මත ය. ක්‍රියාශීලී සාමාජිකයන් පිරිසක් සිටීම අනුව නියමිත පරිදි රැස් වී සාකච්ඡාවෙන් තීන්දු ගැනීමේ හැකියාව ලැබේ.

## ව්‍යවස්ථාමය විධිවිධාන

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව

1. තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලැබූ මන්ත්‍රීවරයන් දස දෙනෙකුගෙන් සමන්විත වූ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට බලය තිබිය යුතු ය.
2. 25අ (10) වන ස්ථාවර නියෝගයෙහි විධිවිධාන යටතේ කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම් සලකා බැලීම එම කාරක සභාවේ කාර්යය විය යුතු ය.
3. යම් පෙත්සමකින්, රජයේ නිලධරයකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ සමාන වෙනත් ආයතනයක නිලධරයකු විසින්

**මහජන පෙත්සම් කාරක සභා ව්‍යුහයක් පළාත් සභාවල ද පවතී. මෙහි දී ක්‍රියාත්මක වන්නේ පාර්ලිමේන්තුවේ මේ හා සම්බන්ධ විධිවිධානමයි. වෙනසකට ඇත්තේ මහජන පෙත්සම් පිළිබඳ නිර්දේශ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු වෙනුවට අදාළ ආයතනවලට ම ඉදිරිපත් කිරීමයි.**

හෝ මූලික අයිතිවාසිකමක් කඩ කරනු ලැබ ඇති බව හෝ වෙනත් අයුක්තියක් සිදු කරනු ලැබ ඇති බව හෝ අනාවරණය වන බව ඒ කාරක සභාවේ අදහස වන අවස්ථාවක විමර්ෂණය කොට වාර්තා කිරීම සඳහා ඒ පෙත්සම, ඒ කාරක සභාව විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්වරයා) වෙත යොමු කරනු ලැබිය හැකි ය.

4. කාරක සභාව විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්වරයා) වෙත යොමු කරනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ඔහු විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවක් කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ඒ වාර්තාව පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ස්වකීය මතය පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලැබිය හැකි ය.

5. කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම් පිළිබඳව ගත යුතු

ක්‍රියාමාර්ගය ගැන මත අදහස් මෙන්ම, ඒ පෙත්සම් සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට සුදුසු යයි තමන් කල්පනා කරන අනිකුත් අදහස් සමග කලින් කලට පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු ය.

6. කාරක සභාවට අවශ්‍ය යයි හැඟී ගිය විටෙක තමන් විසින් නියම කරනු ලැබිය හැකි කවර වූ පෙත්සමක් හෝ වාර්තාවක් හෝ පරීක්‍ෂා කර තමන් වෙත වාර්තා කිරීම

**රාජ්‍ය ආයතන ප්‍රධානීන් සහ පුරවැසි සහභාගිත්වයෙන් පුරවැසි ප්‍රඥප්ති සකස් කිරීම නූතන ලෝකයේ ප්‍රජාව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට එක් කිරීමේ ලක්‍ෂණයකි.**

මහජන පෙත්සම් කාරක සභා ව්‍යුහයක් පළාත් සභාවල ද පවතී. මෙහි දී ක්‍රියාත්මක වන්නේ පාර්ලිමේන්තුවේ මේ හා සම්බන්ධ විධිවිධානමයි. වෙනසකට ඇත්තේ මහජන පෙත්සම් පිළිබඳ නිර්දේශ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු වෙනුවට අදාළ ආයතනවලට ම ඉදිරිපත් කිරීමයි.

## පුරවැසි ප්‍රඥප්ති

රාජ්‍ය ආයතන ප්‍රධානීන් සහ පුරවැසි සහභාගිත්වයෙන් පුරවැසි ප්‍රඥප්ති සකස් කිරීම නූතන ලෝකයේ ප්‍රජාව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට එක් කිරීමේ ලක්ෂණයකි.

**රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය 2007 වසරේ දී හඳුන්වා දුන් පුරවැසි ප්‍රඥප්ති ක්‍රමය පරිපාලන ආයතනවල කාර්යක්‍ෂමතාව නැංවීමෙහි ලා බලපෑවේ ය.**

පුරවැසි ප්‍රඥප්ති මගින් අදාළ ආයතනයෙහි ව්‍යුහය, එමගින් සැපයෙන සේවා සහ එම සේවා ලබා ගන්නා ආකාරය පිළිබඳ සරල ව විස්තර කෙරේ. පුරවැසියන් හට රාජ්‍ය ආයතනවල සේවාවන් කඩිනමින් ලබා ගැනීම සඳහා මේ ක්‍රමවේදය වැදගත් වේ.

පුරවැසි ප්‍රඥප්ති අදාළ ආයතනයෙහි මහජනයාට දක ගත හැකි වන අන්දමින් ප්‍රදර්ශනය කළ යුතු ය.

පුරවැසි ප්‍රඥප්ති දූෂණයට, අල්ලසට මං අහුරයි. තොරතුරු පහසුවෙන් ලබා ගත නොහැකි වූ අවස්ථාවන් හි නිලධාරීන්ට අල්ලස් ලබා දීමේ ප්‍රවනතාවක් ඇති වේ.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය 2007 වසරේ දී හඳුන්වා දුන් පුරවැසි ප්‍රඥප්ති ක්‍රමය පරිපාලන ආයතනවල කාර්යක්‍ෂමතාව නැංවීමෙහි ලා බලපෑවේ ය.

නමුත් අද වන විට රාජ්‍ය ආයතන බොහොමයක් යහපාලනය පිරිහී දේශපාලන බලපෑම් ඇතිවීම මත රාජ්‍ය පරිපාලනය ද කිසියම් බිඳවැටීමකට ලක්ව ඇත.

## ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය



මහජනයාට ඉතාමත් සමීප රජයේ කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බවට විවාදයක් නැත. ඊට හේතුව එයින් ඉටු කෙරෙන පුළුල් කාර්ය භාරයයි.

**මහජනයාට ඉතාමත් සමීප රජයේ කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බවට විවාදයක් නැත. ඊට හේතුව එයින් ඉටු කෙරෙන පුළුල් කාර්ය භාරයයි.**

යටත් විජිත පාලකයන් Public Service නමින් පොදු සේවාවක් පටන් ගත් බවත් එය රාජ්‍ය සේවය ලෙස මව් භාෂාවට පරිවර්තනය වීම ඔස්සේ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය සේවා යනුවෙන් සම්මත වූ බවත් ප්‍රකට පරිපාලන නිලධාරියකු වන විජය වික්‍රමරත්න සඳහන් කරයි. ප්‍රදේශීය ලේකම් කාර්යාලය උපතේ සිට විපත දක්වා සෑම පුද්ගලයකුට ම වැදගත් සේවා රැසක් ඉටු කර දෙන නමුත් එම සේවාවන් සපයන නිලධාරීන් ඇතැම් විට මහජනයා පීඩාවට ලක්කරන තත්ත්වයක් දක්නට ලැබේ.

ඊට හේතුව තමා ලබා ගන්නා සේවාවන්ට අදාළ නීති රීති, චක්‍රලේඛ

**සේවාවන්ට අදාළ නීති රීති, චක්‍රලේඛ සහ කාල රාමු යනාදිය පිළිබඳව පුරවැසියාට අවබෝධයක් නොවීම ය. මේ නිසා සේවාවන් ලබා ගැනීමට අතරමැදියන්ගේ සහාය ලබා ගැනීම සඳහා නැඹුරු විය හැකි ය.**

සහ කාල රාමු යනාදිය පිළිබඳව පුරවැසියාට අවබෝධයක් නොවීම ය. මේ නිසා සේවාවන් ලබා ගැනීමට අතරමැදියන්ගේ සහාය ලබා ගැනීම සඳහා නැඹුරු විය හැකි ය.

## ලබා ගත හැකි සේවා

- උප්පැන්න සහතික පිටපත්
- විවාහ සහතික පිටපත්
- මරණ සහතික පිටපත්
- ජාතික හැඳුනුම්පත්
- බලපත්‍ර
- විශ්‍රාම වැටුප්
- සහතික පත්
- සහනාධාර
- ඉඩම් රාජකාරි
- වැඩිහිටි හා ළමා සුබ සාධනය

උප්පැන්න, විවාහ සහ මරණ සහතිකවල පිටපත් ලබාගත හැක්කේ එය සිදු වූ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පමණි.

ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා අයදුම් පත් ලබාගත හැක්කේ ගමක නම් ග්‍රාම නිලධාරීගෙන් ද වත්තක නම් වතු අධිකාරීවරයාගෙන් ද පාසලක නම් විදුහල්පතිවරයාගෙන් ද පමණි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි බලපත්‍ර මෙසේ ය.

- වාහන සඳහා ආදායම් බලපත්‍ර
- ගල් වළක් පවත්වාගෙන යෑමේ බලපත්‍ර
- වැලිගොඩ දැමීමේ බලපත්‍ර
- රියදුරු බලපත්‍ර වලංගු කාලය දීර්ඝ කිරීම
- විශේෂ ගමන් බලපත්‍ර
- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම
- සතුන් ප්‍රවාහනය කිරීමේ බලපත්‍ර
- මත්පැන් හල් ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීම

විශ්‍රාම වැටුප් සහ වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලියැවිලි ප්‍රදේශීය ලේකම් කාර්යාලයට බාර දිය යුතු ය.

ආදායම් සහතික පත්, වටිනාකම් සහතික, චරිත සහතික සහ පැමිණිලි පිටපත් ප්‍රදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

**ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා අයදුම් පත් ලබාගත හැක්කේ ගමක නම් ග්‍රාම නිලධාරීගෙන් ද වත්තක නම් වතු අධිකාරීවරයා ගෙන් ද පාසලක නම් විදුහල්පති වරයාගෙන් ද පමණි.**

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි සහනාධාර

රෝගාධාර, මහජන ආධාර (පිං පඩි) ආබාධිතයන්ට උපකරණ,

**ඉඩම් සම්බන්ධ ව පුළුල් සේවාවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉටු වේ.**

පුනරුත්ථාපන ආධාර, අනියම් සහනාධාර, ආබාධිත අයට ලබා දෙන නිවාස ආධාර, වැඩිහිටි හා ළමා ආබාධිත ආධාර, විස්තීරණ ආපදා සඳහා ආධාර, සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප්. ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම

ඉඩම් සම්බන්ධ ව පුළුල් සේවාවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉටු වේ. ඒ මෙසේ ය.

- අලුතින් රජයේ ඉඩමක් ලබා ගැනීම
- ජීවිත භුක්තිය ලබා ගැනීම
- මුල් අයිතිය ලබා ගැනීම
- අනවසරයෙන් සංවර්ධනය කළ ඉඩමක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීම
- එල් එල් බලපත්‍රයක් "රන්බිම" දීමනා පත්‍රයක් බවට හරවා ගැනීම.
- බලපත්‍රයක හෝ දීමනා පත්‍රයක (ඔප්පුවක) පසු අයිතිය නම් කිරීම.
- ස්වර්ණභූමි, ජයභූමි හෝ රන්බිම දීමනා පත්‍රයක් ඇපයට තබාගෙන මුදලක් ලබාගැනීම.
- ඉඩම භුක්ති විඳීම පිළිබඳ ගැටලු නිරාකරණය

- වාර්ෂික ව බදු ගෙවන ඉඩම් පිළිබඳ අයිතිය
- රජයට අත්පත් කරගත් ඉඩමක්/ගොඩනැගිල්ලක් සඳහා වන්දි ලබා ගැනීම

දැව රාජකාරී යටතේ දැව හෙලීම සහ දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා දීම සිදු කෙරේ. දැව හෙලීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ දී ඉඩමේ ස්වභාවය, ගස්වල ප්‍රමාණය, ගස්වල වර්ගය සලකා බැලේ.

**දැව රාජකාරී යටතේ දැව හෙලීම සහ දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා දීම සිදු කෙරේ. දැව හෙලීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ දී ඉඩමේ ස්වභාවය, ගස්වල ප්‍රමාණය, ගස්වල වර්ගය සලකා බැලේ.**

ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ස්ථිර නිවසක් නොමැති වැඩිහිටියන් වැඩිහිටි නිවාසවලට යොමු කිරීම සහ ආබාධිත ළමුන් නිවාස ගත කිරීම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුභ සාධනය, වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා දැනුවත් කිරීම ආදි සේවාවන් සුභ සාධනය යටතේ ක්‍රියාත්මක කෙරේ.

සුනාමියෙන් විපතට පත් වූවන් සඳහා පත්කරන ලද සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම ද සුභසාධන සේවාවන්ට අයත් වේ.

**බලය බෙදා හැරීම, විමධ්‍යගත කරණය සහ සහභාගිත්ව පාලන ක්‍රමය ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ සමතුලන හා තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමෙහි ලා මූලිකවීම මේ අමාත්‍යාංශයේ කාර්යභාරයයි.**

## පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

බලය බෙදා හැරීම, විමධ්‍යගතකරණය සහ සහභාගිත්ව පාලන ක්‍රමය ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත හා තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමෙහි ලා මූලිකවීම මේ අමාත්‍යාංශයේ කාර්යභාරයයි.

අමාත්‍යාංශයේ ක්‍රියාමාර්ග මෙසේ දැක්වේ.

1. මධ්‍යම රජය සහ පළාත් සභා අතර මනා සම්බන්ධීකරණය.
2. පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා සහයවීම
3. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ කාර්යක්ෂම ලෙස කටයුතු කිරීම සහ පළාත් සභා සහ පළාත් ආයතනවලට සහයවීම.

4. පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා මූල්‍ය, තාක්ෂණ හා නෛතිකත්වය ලබාදීම.

5. පළාත් සභා සහ පළාත් පාලන ආයතන මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන විමධ්‍යගතකරණය සහ ඵලදායකත්වය ප්‍රවර්ධන ක්ෂේත්‍ර සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම දිරිමත් කිරීම.

6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන කටයුතු සම්බන්ධයෙන් අන්තර්ජාතික සබඳතා තහවුරු කිරීම.

7. විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ විධායක හා සම්බන්ධීකරණ ආයතනය වශයෙන් කටයුතු කිරීම.

8. පළාත් පාලන ආයතනවල භෞතික, ආර්ථික හා සමාජීය යටිතලපහසුකම් සංවර්ධනය කිරීමට සහයවීම

**පළාත් සභා සහ පළාත් පාලන ආයතන කටයුතු සම්බන්ධයෙන් අන්තර්ජාතික සබඳතා තහවුරු කිරීම.**

**විගණකාධිපති දෙපාර්ත මේන්තුව පිහිටුවීමේ අරමුණ නිවැරදි විගණන වාර්තා පාර්ලිමේන්තුවට ලබාදෙමින් යහපාලනය ශක්තිමත් කිරීම සඳහා දායක වීම ය.**

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණ නිවැරදි විගණන වාර්තා පාර්ලිමේන්තුවට ලබාදෙමින් යහපාලනය ශක්තිමත් කිරීම සඳහා දායක වීම ය. විගණනයට ලක් කෙරෙන ආයතන මෙසේ ය.

රජයේ දෙපාර්තමේන්තු, කැබිනට් අමාත්‍ය මණ්ඩල කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, පරිපාලන කටයුතු පිළිබඳ, පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලය, පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය, මැතිවරණ කොමසාරිස් කාර්යාලය, පළාත් පාලන ආයතන කාර්යාල, රාජ්‍ය සංස්ථා කාර්යාල, ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුව වෙත පැවරී ඇති වෙළෙඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාරවල ගිණුම් විගණකාධිපති තනතුර මෙ රට ව්‍යවස්ථාවට වගකිව යුතු තනතුරක් බවට පත් වූයේ 1931 ඩොනොමෝර් ව්‍යවස්ථාව හා 1947 සෝල්බරි ව්‍යවස්ථාව අනුව ය.

ඒ අනුව විගණකාධිපතිවරයාට විශාල විෂය පථයක වගකීම පැවරිණි.

එහෙත් ශ්‍රී ලංකාවේ විගණකාධි--පතිවරයාගේ විෂය පථය පුළුල් එකක් වුව ද, විගණන ක්‍රියාවලිය අර්ථාන්විත එකක් වීම අහුරා තිබේ. ඊට හේතුව පාර්ලිමේන්තුවට බාර දෙන විගණන වාර්තාවලින් අනාවරණය කෙරෙන බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවක් නොපෙනීමයි. උදාහරණයක් වශයෙන් හිටපු විගණකාධිපති එස්.සී. මායාදුන්න රාජකාරි කළ සමයෙහි විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය ශක්තිමත් විය. ඇතැම් රාජ්‍ය ආයතනවල මූල්‍ය අක්‍රමිකතා රැසක් අනාවරණය කර ගත හැකි විය. එහෙත් ඒ පිළිබඳ නීතිමය පියවර ගනිමින් මූල්‍ය අක්‍රමිකතා වලක්වා ගැනීමට පියවර නොගන්නා ලදි. පළාත් පාලන ආයතනයන්හි හා විශ්වවිද්‍යාලයන්හි දූෂණ සම්බන්ධයෙන් අධිභාර පැනවීමේ බලය විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඇත. දෙපාර්ත--මේන්තුව යටතේ ප්‍රාදේශීය කාර්යාල ද පිහිටුවා ඇති අතර, මහජන පැමිණිලි ද සලකා බලනු ලැබේ.

**ශ්‍රී ලංකාවේ විගණකාධිපති වරයාගේ විෂය පථය පුළුල් එකක් වුව ද, විගණන ක්‍රියාවලිය අර්ථාන්විත එකක් වීම අහුරා තිබේ.**

**අල්ලස් පණත 1954 දී නීතිගත කිරීමෙන් පසුව 1958 වර්ෂයේ අල්ලස් දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදි.**

## අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව

අල්ලස් පණත 1954 දී නීතිගත කිරීමෙන් පසුව 1958 වර්ෂයේ අල්ලස් දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සහ අල්ලස් පණත හා ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පණත යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු පවරන ලෙස විධානය කිරීම සඳහා මෙම ස්ථිර කොමිෂන් සභාව 1994 අංක 19 දරන පණතින් පිහිටුවන ලදි. ප්‍රථම කොමිෂන් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලද්දේ 1994 දෙසැම්බර් 15 දා ය.

කොමිසමේ සාමාජිකයන් සංඛ්‍යාව 3කි. ඔවුන්ගෙන් දෙදෙනකු විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරන් හෝ

අභියාචනාධිකරණ විනිසුරන් විය යුතු අතර එක් සාමාජිකයකු අපරාධ විමර්ශනයට හා නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළව පළපුරුද්දක් ඇති අයකු විය යුතු ය.

**අල්ලස් හෝ දූෂණ චෝදනා භාර ගැනීම ඒ ගැන විමර්ශන කටයුතු කිරීම, නඩු පැවරීම හා නඩු මෙහෙයවීම කොමිෂන් සභාවේ කාර්යභාරය වේ.**

අල්ලස් හෝ දූෂණ චෝදනා භාර ගැනීම ඒ ගැන විමර්ශන කටයුතු කිරීම, නඩු පැවරීම හා නඩු මෙහෙයවීම කොමිෂන් සභාවේ කාර්යභාරය වේ. ඕනෑම පුද්ගලයකු කොමිසම ඉදිරියට කැඳවීමට ඔහුට එරෙහි ව චෝදනා පරීක්ෂා කිරීමට පරීක්ෂණ අවසන් වනතුරු විදෙස් ගමන් බලපත්‍රය අත්හිටුවීමට, දේපළ හිමිකම් මාරුකර ලියාපදිංචිය වැළැක්වීමට චෝදනා තහවුරු වේ නම් නඩු පැවරීමට හා මෙහෙයවීමට කොමිසමට බලය තිබේ.

එහෙත් පැමිණිල්ලක් ලැබීමකින් තොර ව චෝදනා විමර්ශනය කිරීමේ හැකියාවක් කොමිසමට නැත.

අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිසමෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ ව මහජනයා අතර එතරම් ප්‍රසාදයක් නොමැත. ලැබී ඇති පැමිණිලි අතරින් තෝරුන් මෝරුන් මඟහැර හාල්මැස්සන්ට එරෙහි ව පමණක්

චෝදනා විමර්ශනය කෙරෙන බවට චෝදනා නැගී තිබේ. රජයේ ඉහළම ඇමතිවරුන් හා ආයතන ප්‍රධානීන් ගණනාවකට එරෙහි ව කොමිසමට ලැබුණු පැමිණිලි විමර්ශන අවසන් කළ බවක් ද නො පෙනේ.

## අධිකරණ සේවා කොමිෂන් සභාව



**මෙම කොමිෂන් සභාව අග්‍ර විනිශ්චයකාර වරයාගෙන් සහ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධි කරණයේ වෙනත් විනිශ්චය කාරවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.**

මෙම කොමිෂන් සභාව අග්‍ර විනිශ්චයකාරවරයාගෙන් සහ 41 (ඇ) ව්‍යවස්ථාවේ විධි විධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. අග විනිසුරු එහි සභාපතිවරයා ය.

මහාධිකරණ විනිසුරුවරුන්ගේ ස්ථාන මාරු කිරීමේ බලය මෙම කොමිසමට ඇත. අධිකරණ නිලධාරීන් හා උපලේඛන ගත රජයේ නිලධාරීන් පත් කිරීමේ උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, සේවයෙන් පහ කිරීමේ හා ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාවේ යෙදවීමේ බලය කොමිසමට ඇත.

යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය කරන යටිතල සේවා සැපයීම, විනිසුරුවරුන්ගේ ස්වාධීනත්වය

**එහෙත් අගවිනිසුරු සරත් නන්ද සිල්වා මහතාගේ සමයෙහි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් විවිධ ගැටලු ඇති විය.**

ආරක්ෂා කිරීම සහ අධිකරණ කාර්යමණ්ඩලවල සහාය කාර්ය මණ්ඩවල හරියාකාර මානව සම්පත් කළමනාකාරණය පවත්වාගෙන යාම මගින් සෑම පුරවැසියකුට ම නීතියේ රැකවරණය කඩිනමින් සහ එක සමානව ලබාදීම කොමිසමේ අරමුණයි.

එහෙත් අගවිනිසුරු සරත් නන්ද සිල්වා මහතාගේ සමයෙහි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් විවිධ ගැටලු ඇති විය. එහි ස්වාධීනත්වය පිළිබඳ මහජන විශ්වාසය පළුදු විය.

## මැතිවරණ දෙපාර්තමේන්තුව

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු යැයි 17 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 193 (2) හි සඳහන් වේ.

103 (1) හි මෙසේ දැක්වේ,

*කොමිෂන් සභාව වෘත්තීන්හි හෝ පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රවල විශිෂ්ඨතා හිමිකරගෙන සිටින තැනැත්තන් අතුරෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පතර කරනු ලැබිය යුත්තේ ය.*

**නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු යැයි 17 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 193 (2) හි සඳහන් වේ.**

**නමුත් අදටත් විධිමත් මැතිවරණ කොමිසමක් පත්කොට නැත. ඒ වෙනුවෙන් එකී බලතල මැතිවරණ කොමසාරිස් යටතේ පවතී.**

17 වැනි සංශෝධනය මගින් මැතිවරණ කොමිෂන් සභාවක් ස්ථාපිත කරන ලද්දේ නිදහස් ඡන්ද ක්‍රමයකට බාධා පැමිණවීම සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් පැවති කතිකාවත හේතුවෙනි. සභාපතිවරයා නිර්දේශ කිරීම ව්‍යවස්ථා සභාව මගින් සිදු කිරීම තුළින් තනතුරෙහි අපක්ෂපාතිත්වය තහවුරු කිරීම එහි අරමුණ විය.

104 ආ (2) හි සඳහන් වන අන්දමට යම් ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ සියලු ම නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීම කොමිෂන් සභාවේ කාර්යය විය යුතු අතර එසේ ඒ නීති බලාත්මක කිරීම සුරක්ෂිත කිරීමෙහි ලා කොමිෂන් සභාවේ සහයෝගය දක්වීම ඒ නීති බලාත්මක කිරීම භාර ව සිටින සියලු ම රජයේ බලධරයන්ගේ කාර්යය විය යුත්තේ ය. නමුත් අදටත් විධිමත් මැතිවරණ කොමිසමක් පත්කොට නැත. ඒ වෙනුවෙන් එකී බලතල මැතිවරණ කොමසාරිස් යටතේ පවතී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඕනෑ ම මැතිවරණයක දී පොදු දේපල අයථා පරිහරණය වැළැක්වීමට බලය පවරා ඇත. එම විධිවිධාන අනුව මැතිවරණ

කොමසාරිස්වරයා 2010 ජනාධිපති ලේකම් ඇතුළු රාජ්‍ය සේවයේ ඉහළ නිලතල දරන ලේකම්වරුන්ට කරන ලද නියෝගයෙහි මෙසේ සඳහන් වේ.

*04. එම ව්‍යවස්ථාවේ (ආ) උප වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපළ භාරව සිටින සියලු තැනැත්තන් බැඳී සිටී. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජය සතු හෙලිකොප්ටර් වැනි ගුවන් යානා යොදවා ගන්නා බවට පසුගිය මැතිවරණ අවස්ථාවල දී මේ දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබී ඇත. එබැවින් රජයේ වාහන භාරව සිටින සියලු නිලධාරීන් එම වාහන යම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයාගේ ඡන්ද ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා නො වන ආකාරයට මැතිවරණ කාල සීමා ව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු බව අවධාරණය කරමි.*

*05. රජයේ කාර්යාල ගොඩනැගිලි, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජයේ සම්පත් වන බැවින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යෙදී සිටින පුද්ගලයන්ට*

**රජයේ කාර්යාල ගොඩනැගිලි, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජයේ සම්පත් වන බැවින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යෙදී සිටින පුද්ගලයන්ට රජය සතු සංචාරක නිවාස තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන් ම තහනම් බව ද සැලකිය යුතු ය.**

**1981 අංක 15 දරණ ජනාධිපති මැතිවරණය පිළිබඳ පණතෙහි ඇති පරිදි කිසිදු අපේක්ෂකයෙකුට මැතිවරණ කාල සීමාවේදී රජයේ මුදලින් ආහාර හෝ වෙනත් සංග්‍රහ පැවැත්වීම වරදක් බව සඳහන් කර ඇති නමුත් අරලියගහ මන්දිරය අනුරාධපුර සහ මහනුවර යනාදී ස්ථානවල දහස් ගණනකට සාද සහ ආහාර සංග්‍රහ පවත්වා තිබේ.**

*රජය සතු සංචාරක නිවාස ථානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන් ම තහනම් බව ද සැලකිය යුතු ය.*

එමෙන් ම මැතිවරණ කාලය තුළ දී ස්ථාන මාරු කිරීම්, රජයේ හා සංස්ථාවල තනතුරු සහ උසස්වීම් ප්‍රදානය කිරීම, නවකයන් බඳවා ගැනීම, ඉල්ලුම්පත් කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම යනාදිය ද නොකළ යුතු බව එම නියෝගයෙහි දක් වේ.

1981 අංක 15 දරණ ජනාධිපති මැතිවරණය පිළිබඳ පණතෙහි ඇති පරිදි කිසිදු අපේක්ෂකයෙකුට මැතිවරණ කාල සීමාවේදී රජයේ මුදලින් ආහාර හෝ වෙනත් සංග්‍රහ පැවැත්වීම වරදක් බව සඳහන් කර ඇති නමුත් අරලියගහ මන්දිරය අනුරාධපුර සහ මහනුවර යනාදී ස්ථානවල දහස් ගණනකට සාද සහ ආහාර සංග්‍රහ පවත්වා තිබේ. එමෙන් ම මැතිවරණ කොමසාරිස්වරයා ජනාධිපති ලේකම් ඇතුළු නිලධාරීන්ට කළ නියෝගය සම්බන්ධයෙන් කොමසාරිවරයාට කරුණු දක්වීමක් කිසිදු නිලධාරියකු විසින් සිදු කර නොමැත.

**මෙහි භයානකම කරුණ වන්නේ මැතිවරණ කොමසාරිස් වරයාට ඇති බලතල අනුව මැතිවරණ නීති කැඩීමට එරෙහිව ඔහුගේ නිර්දේශ ක්‍රියාත්මක නොකර සිටීම හෝ, මේ තත්වය හමුවේ මැතිවරණ කොමසාරිස්වරයා නිහඬ ව සිටීම ය.**

එහෙත් මෙවැනි අවස්ථාවන් වාර්තා වූ විට ඊට අදාළ නීතිමය පියවර ගැනීමට ඉන්දීය මැතිවරණ කොමිසම කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ පැවැත්වෙන හැම මැතිවරණයක දී ම පාහේ පොදු මාර්ග ප්‍රවාහන සේවාවේ ප්‍රධානතම ආයතනය වන ශ්‍රී ලංගමට අයත් බස් රථ මැතිවරණ රැළි පැවැත්වීම සඳහා භාවිත කෙරේ. එබඳු අවස්ථාවන්හි දී අදාළ මාර්ගයන්හි පාසල් ළමුන් ද ඇතුළු මඟී ජනතාව දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දීම පොදු යථාර්ථයක් බවට පත් ව තිබේ. මෙහි භයානකම කරුණ වන්නේ මැතිවරණ කොමසාරිස්වරයාට ඇති බලතල අනුව මැතිවරණ නීති කැඩීමට එරෙහිව ඔහුගේ නිර්දේශ ක්‍රියාත්මක නොකර සිටීම හෝ, මේ තත්වය හමුවේ මැතිවරණ කොමසාරිස්වරයා නිහඬ ව සිටීම ය. මැතිවරණ කොමසාරිස්වරයා අපක්ෂපාතී ව රාජකාරියෙහි යෙදීමෙන් උරණ වීම නිසා රාජ්‍ය මාධ්‍ය යොදාගෙන එම තනතුර හෑල්ලු කෙරෙන ප්‍රකාශ නිකුත් කිරීම ද සිදු වේ.

මෙයින් සිදුවන්නේ ඡන්දදායකයාගේ අයිතිය තහවුරු කිරීම සඳහා ස්ථාපිත කර ඇති ආයතන ව්‍යුහයන් දුර්වලවීම

**රජයේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සියල්ල මැතිවරණ සමයේ දී ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයන් දිරි ගැන්වීම සඳහා විරුද්ධ පක්ෂ අපෙක්ෂකයන්ට පහරදීම සඳහා විශාල අවකාශයක් ලබා දෙයි. මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා නිකුත් කරන නියෝග නොසලකා හැරේ.**

හා සර්වජන ඡන්ද අයිතිය අර්ථවත් නොවීම ය.

ඡන්දදායකයාගේ අයිතිය තහවුරු කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා මැදිහත් වූ අවස්ථා ඵලදායක නොවූ බවට දක්විය හැකි තවත් අවස්ථාවක් වන්නේ රාජ්‍ය මාධ්‍ය ආයතන මැතිවරණ නීති උල්ලංඝනය කිරීම ය. සෑම මැතිවරණයක දී ම පාහේ මැතිවරණ කොමසාරිස්වරයා නිකුත් කරන නිර්දේශ නොසලකා ජනමාධ්‍ය කටයුතු කරනු පෙනේ. ලේක්හවුස් ආයතනය ආණ්ඩුවේ මැතිවරණ පොස්ටර් මුද්‍රණය කර බෙදා හැරීමට අමතරව පුද්ගලික මුද්‍රණාල සඳහා කඩදාසි ලබාදීම ද සිදු කරයි.

එමෙන් ම රජයේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සියල්ල මැතිවරණ සමයේ දී ආණ්ඩුවේ අපේක්ෂකයන් දිරි ගැන්වීම සඳහා විරුද්ධ පක්ෂ අපෙක්ෂකයන්ට පහරදීම සඳහා විශාල අවකාශයක් ලබා දෙයි. මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා නිකුත් කරන නියෝග නොසලකා හැරේ.

මාධ්‍ය මගින් මැතිවරණ නීති උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා නිසි බලධාරියකු මැතිවරණ කොමසාරිස්වරයා විසින් පත් කරනු

ලබන අවස්ථාවන්හි ද බලධරයාගේ නිර්දේශ නොසලකා හැරේ. රජයේ ආයතන සංග්‍රහයේ xxxii පරිච්ඡේදයෙහි සඳහන් වන අන්දමට රාජ්‍ය සේවයේ යෙදෙමින් ඡන්දය ප්‍රකාශ කිරීම හැර මැතිවරණ කටයුතුවල යෙදිය නොහැකි අය මෙ පරිදි ය.

මැතිවරණ දෙපාර්තමේන්තුවේ රාජකාරිවල නියුතු නිලධාරීහු

- ආරක්ෂක හමුදා සාමාජිකයෝ
- අධිකරණ නිලධාරීහු
- රාජ්‍ය සේවයේ නිලධාරීහු
- බන්ධනාගාර නිලධාරීහු
- පොලිස් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා බලය පැවරෙන නිලධාරීහු

එහෙත් මේ සෑම ක්ෂේත්‍රයකට ම අයත් රාජ්‍ය සේවකයන් මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල යෙදෙනු පෙනේ.

මෙබඳු ක්‍රියාමාර්ග වැළැක්වීම හෝ නීති උල්ලංඝනය කරන්නාවූන් සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට පූර්ණ බලතල ලබාදීමේ අවශ්‍යතාවක් පවතී.

**මැතිවරණ දෙපාර්ත මේන්තුවේ රාජකාරිවල නියුතු නිලධාරීන් මෙසේය.**

**ආරක්ෂක හමුදා සාමාජිකයෝ**

**අධිකරණ නිලධාරීහු**

**රාජ්‍ය සේවයේ නිලධාරීහු**

**බන්ධනාගාර නිලධාරීහු**

**පොලිස් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා බලය පැවරෙන නිලධාරීහු**

**යම් රටක ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම තහවුරු කිරීම සඳහා දායක වීම දේශපාලන පක්ෂයක මූලික වගකීම වේ. දේශපාලන පක්ෂයක් යනු ක්‍රියාකාරී සිවිල් පුරවැසියන්ගේ එකමුතුවකි.**

## දේශපාලන පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය

යම් රටක ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම තහවුරු කිරීම සඳහා දායක වීම දේශපාලන පක්ෂයක මූලික වගකීම වේ. දේශපාලන පක්ෂයක් යනු ක්‍රියාකාරී සිවිල් පුරවැසියන්ගේ එකමුතුවකි.

රටක ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ වගකීම ඉටුකිරීමේ හැකියාව ලැබෙන්නේ පක්ෂය තුළ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කළහොත් පමණි.

### දේශපාලන පක්ෂයක වගකීම්

1. පුරවැසියන් දේශපාලන වශයෙන් දැනුවත් කිරීම.
2. දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ගැටලු හා ඒවා විසඳීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සමාජ කතිකාවක් ගොඩනැගීම.
3. පක්ෂ සාමාජිකයන්ගේ ශක්‍යතා සහ නායකත්ව ලක්ෂණ හඳුනා ගනිමින් ඒවා වර්ධනය කරගැනීමට අනුබල දීම.
4. පක්ෂ සාමාජිකයන්ගේ සක්‍රීය දායකත්වය පවත්වා ගෙන යෑම.

5. පක්ෂය ආණ්ඩු බලය ලබා ගන්නා විට පක්ෂය තුළත් රට තුළත් පුද්ගලයන්ට සමාන හා සාධාරණ අවස්ථා ලබා දීම.

දේශපාලන පක්ෂයක ව්‍යවස්ථාව ගොඩනැගීමේ දී හුදු නායකයාගේ හෝ ප්‍රධානීන් කිහිප දෙනාගේ අදහස් පමණක් සැලකිල්ලට නො ගත යුතු ය.

පහළ සිට ඉහළට එනම් පුරවැසියන්ගේ අභිලාෂ තේරුම් ගැනීම හා ඒවා නියෝජනය කිරීම සාර්ථක ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේ මඟකි.

එමෙන් ම පක්ෂයේ අරමුදල් රහස්‍ය නොවිය යුතු අතර ලැබීම් සහ වැයවීම් පිළිබඳව වාර්ෂිකව පක්ෂ සාමාජිකයන් දැනුවත් කළ යුතු ය.

නියමිත කාලයට පක්ෂ සම්මේලනය පැවැත්වීම, නිසි කලට නියමිත පරිදි සිදු කළ යුතු ය. ආසන සංවිධායකවරුන් පත් කිරීම දිස්ත්‍රික් සම්මේලනයේ දී පක්ෂ සාමාජිකයන්ගේ ඡන්දයෙන් කළ යුතු ය. පක්ෂ නායකත්වය තීන්දු කළ යුත්තේ පක්ෂ සාමාජිකයන්ගේ චන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ගේ බහුතර කැමැත්තෙනි. පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කළ හැකි එක් මඟක් වන්නේ මැතිවරණ කොමිසම

**ආසන සංවිධායකවරුන් පත් කිරීම දිස්ත්‍රික් සම්මේලනයේ දී පක්ෂ සාමාජිකයන්ගේ ඡන්දයෙන් කළ යුතු ය. පක්ෂ නායකත්වය තීන්දු කළ යුත්තේ පක්ෂ සාමාජිකයන්ගේ චන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ගේ බහුතර කැමැත්තෙනි.**

**දේශපාලන පක්ෂවල කෘත්‍යාධිකාරී මණ්ඩල හා නායකත්ව මණ්ඩල හා උත්තරීතර මණ්ඩල වැනි කණ්ඩායම් නායකයන්ගේ අභිමතය අනුව පත්කරගෙන, එම කණ්ඩායම්වල පිහිටෙන් දිගට ම නායකත්වයෙහි රැඳී සිටීමේ නරක සම්ප්‍රදායක් පවතී.**

බලගැන්වීම මගින් දේශපාලන පක්ෂවල ප්‍රජාතන්ත්‍ර විරෝධි කටයුතු පාලනය කිරීමේ හැකියාව ලබා දීමෙනි.

ඇතැම් දේශපාලන පක්ෂ කිසි දිනෙක තම අරමුණු පිළිබඳ අය වැය ලේඛන ඉදිරිපත් නොකරයි. පක්ෂවල මූල්‍ය කටයුතු විගණනය කිරීමේ, සහ පක්ෂ තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිසමට හෝ මැතිවරණ කොමසාරිස්වරයාට ලැබිය යුතු ය.

පක්ෂයේ නායකයන් පත්කිරීම, මූල්‍ය කටයුතු ඇතුළු සියල්ල නිශ්චිත වශයෙන් පක්ෂ ව්‍යවස්ථාවේ සඳහන් විය යුතු ය. වත්මනෙහි ශ්‍රී ලංකාවේ ඇතැම් දේශපාලන පක්ෂවල කෘත්‍යාධිකාරි මණ්ඩල හා නායකත්ව මණ්ඩල හා උත්තරීතර මණ්ඩල වැනි කණ්ඩායම් නායකයන්ගේ අභිමතය අනුව පත්කරගෙන, එම කණ්ඩායම්වල පිහිටෙන් දිගට ම නායකත්වයෙහි රැඳී සිටීමේ නරක සම්ප්‍රදායක් පවතී. එමෙන් ම පක්ෂයේ ව්‍යවස්ථාව නොසලකා හැර කටයුතු කරන අවස්ථා ද ඇත. මෙය අසෝබන තත්ත්වයකි. බොහෝ දියුණු බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රටවල දේශපාලන පක්ෂ ක්‍රියාත්මක වන්නේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමිනි. 1980 වසරේ කොංග්‍රස්

පක්‍ෂයේ සිටි ජ්‍යෙෂ්ඨතම සහ බහුජන කැමැත්ත දිනා සිටි නායිකාව වූයේ ඉන්දිරා ගාන්ධි ය.

අගේ නම පක්‍ෂ නායකත්වයට යෝජනා කරද්දී තවත් නම් තිබේ දැයි මුලසුන විමසා සිටියේ ය. එහෙත් වෙනත් නම් යෝජනා වූයේ නැත. වරක් ඕස්ට්‍රේලියාවේ අගමැති බලයේ සිටියදීම ඔහු පක්‍ෂයෙන් ඉවත් කිරීමට ඔහු අයත් දේශපාලන පක්‍ෂය කටයුතු කළේ ය.

**බලයේ සිටින දේශපාලන පක්‍ෂය, විරුද්ධ මත දරන දේශපාලන පක්‍ෂ දුර්වල කිරීම සඳහා යටිකූට්ටු වැඩ කිරීමේ පිළිවෙතක් නොදියුණු දේශපාලන සංස්කෘතියක් ඇති රටවල දක්නට ලැබේ.**

බලයේ සිටින දේශපාලන පක්‍ෂය, විරුද්ධ මත දරන දේශපාලන පක්‍ෂ දුර්වල කිරීම සඳහා යටිකූට්ටු වැඩ කිරීමේ පිළිවෙතක් නොදියුණු දේශපාලන සංස්කෘතියක් ඇති රටවල දක්නට ලැබේ.

විපක්‍ෂයේ මන්ත්‍රීවරුන් (බා ගැනීම) ආණ්ඩු පක්ෂයට ගැනීම සඳහා මුදල් හෝ වෙනත් සම්පත් යෙදවීම, තමන්ට අභියෝගයක් වන පක්‍ෂවල ක්‍රියාකාරි මට්ටමේ නායකයන් නීතියේ ග්‍රහණයට හසු කිරීම සඳහා සැලසුම් යෙදීම, චරිත ඝාතනය හෝ කායික අඩන්තේට්ටම් පැමිණවීම මෙහි ස්වභාවයයි. එහෙත් ශක්තිමත් විරුද්ධ පක්‍ෂයක් පැවතීම ප්‍රජාතන්ත්‍රවාදී යහපැවැත්ම කෙරෙහි බලපවත්වන ප්‍රධාන සාධකයකි. විරුද්ධ

**විරුද්ධ පක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට මාරු වූ දේශපාලකයාගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි නොවීමට අදාළ වන වැරදි තීන්දුවක් අධිකරණයෙන් ලබා දී තිබීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණ ක්‍රියාවලියේ දී ඡන්දදායකයාගේ මතයට කරන ලද බලවත් නිගරුවකි.**

පක්ෂයේ දේශපාලනඥයන් නීතියේ රැහැනට හසුකිරීමට ආණ්ඩු පක්ෂයට හැකි වී ඇත්තේ දෙපක්ෂයේ ම දේශපාලකයන් දූෂණ හා වංචාවල යෙදී ඇති නිසා ය. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු නීතියේ රැහැනට හසුකර ගැනීමට සූදානම්වීම ඔහු ආණ්ඩුපක්ෂයට එකතු කර ගැනීමේ උපක්‍රමයක් බවට ද පත් ව තිබේ. ශ්‍රී ලංකාවේ මේ අසෝබන දේශපාලන සම්ප්‍රදාය හොඳින් කැපී පෙනේ. ආණ්ඩුපක්ෂයේ පැවැත්ම සඳහා අත දිග හැර වියදම් කිරීමේ හැකියාව ඇති මන්ත්‍රීවරයාට දූෂිත මාර්ගවලින් ධනය උපයා ගැනීමට ඉඩදීමේ අනුගමනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ කුඩු ජාවාරම, එතනෝල් ජාවාරම ඇතුළු නීතිවිරෝධි භාණ්ඩ ආනයනයට පුළුල් ඉඩ කඩක් විවර වී ඇත්තේ ඒ නිසා ය.

විරුද්ධ පක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට මාරු වූ දේශපාලකයාගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි නොවීමට අදාළ වන වැරදි තීන්දුවක් අධිකරණයෙන් ලබා දී තිබීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණ ක්‍රියාවලියේ දී ඡන්දදායකයාගේ මතයට කරන ලද බලවත් නිගරුවකි.

## පාරිභෝගික සේවා කටයුතු අධිකාරිය

1979 අංක 1 දරන පාරිභෝගික ආරක්‍ෂණ පණත, 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පණත සහ 1950 මිල පාලන පණත (173 වන අධිකාරිය වූ) අහෝසි කරමින් 2003, අංක 9 දරන පාරිභෝගික කටයුතු අධිකාරී පණත යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවන ලදි.

සභාපතිවරයකු යටතේ කර්මාන්ත නීතිය, ආර්ථික විද්‍යාව, වානිජ්‍යය, පරිපාලනය, ගිණුම්කරණය, විද්‍යාව හෝ සෞඛ්‍ය ක්ෂේත්‍ර නියෝජනය කරන ඒ සම්බන්ධ පළපුරුද්දක් ඇති සාමාජිකයන් දහ දෙනෙකුට නො අඩු සංඛ්‍යාවක් මෙහි කාර්ය මණ්ඩලයට අයත් වේ.

**සභාපතිවරයකු යටතේ කර්මාන්ත නීතිය, ආර්ථික විද්‍යාව, වානිජ්‍යය, පරිපාලනය, ගිණුම්කරණය, විද්‍යාව හෝ සෞඛ්‍යය ක්ෂේත්‍ර නියෝජනය කරන ඒ සම්බන්ධ පළපුරුද්දක් ඇති සාමාජිකයන් දහ දෙනෙකුට නො අඩු සංඛ්‍යාවක් මෙහි කාර්ය මණ්ඩලයට අයත් වේ.**

**නිසි ප්‍රමිතියක් නොමැති භාණ්ඩ වෙළෙඳ පොළෙහි බහුල වීම නිසා පාරිභෝගිකයන් ගසාකෑමට ලක්වීම සුලබ තත්ත්වයක් බවට වී තිබේ.**

මෙහි අරමුණු

වෙළෙඳාම විධිමත් කිරීම ඔස්සේ

1. තෘප්තිමත් වූ පාරිභෝගිකයන් බිහි කිරීම
2. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වල දී පාරිභෝගිකයාට සහන සැලසීම
3. අධ්‍යාපන සහ දැනුවත් කිරීම මගින් පාරිභෝගිකයන් සවිබල ගැන්වීම
4. තරග විරෝධී චර්යාවන්ට එරෙහිව වෙළෙන්දන් හා නිෂ්පාදකයන් ආරක්ෂා කරමින් යහපත් තරගකාරිත්ව ප්‍රවර්ධනය
5. අධිකාරියෙහි කටයුතු පුළුල් කිරීම ඔස්සේ ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම

නිසි ප්‍රමිතියක් නොමැති භාණ්ඩ වෙළෙඳ පොළෙහි බහුල වීම නිසා පාරිභෝගිකයන් ගසාකෑමට ලක්වීම සුලබ තත්ත්වයක් බවට වී තිබේ. මේ තත්ත්වය වළක්වා ගැනීමට බාධාවක් වී තිබෙනුයේ පාරිභෝගික කටයුතු අධිකාරියෙහි වැටලීම් අංශය පුළුල් නොවීම හා දීප ව්‍යාප්ත නියෝජනයක් ලබාදීමට අසමත් වීම බව පෙනේ.

## ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

මෙය පිහිටුවා ඇත්තේ බහුතර යටිතල කර්මාන්තයන් නියාමනය කිරීම සඳහා බහු ආංශික නියාමන ආයතනයක් ලෙස ය. 2002 දී පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පණත මගින් විදුලි බල හා බල සේවා කර්මාන්ත නියාමනය සිදු කිරීම සඳහා විධිවිධාන සපයන ලදි.


2006 ඛනිජ තෙල් කර්මාන්තය ද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මගින් නියාමනය කළ යුතු කර්මාන්ත ලැයිස්තුවට එකතු කරන ලදි.

විදුලිබල කර්මාන්තයේ ප්‍රයෝජනවත් ආයෝජන කාර්යක්ෂම සැලසුම සහ ගුණාත්මක සේවා තත්ත්වය සහතික කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විදුලි

**2002 දී පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පණත මගින් විදුලි බල හා බල සේවා කර්මාන්ත නියාමනය සිදු කිරීම සඳහා විධිවිධාන සපයන ලදි.**

බලය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම සැපයුම හා භාවිතය නියාමනය කරයි.

එහි පළමු කොමසාරිස්වරුන් කණ්ඩායම සහ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා පත් කිරීමත් සමග 2003 වර්ෂයේ සිට ආයතනයක් වශයෙන් සිය කටයුතු ආරම්භ කළේ ය.



## කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය

කම්කරු වන්දි ඉල්ලමින් ඉදිරිපත් කෙරෙන පැමිණිලි බාර ගැනීම, පිළිගත් වන්දි ඉල්ලීම් පිළිබඳ පරීක්ෂණ පවත්වා එම ඉල්ලීම් ලබාදීමෙන් හෝ ප්‍රතික්ෂේප කිරීමෙන් ගැටලුව විසඳීම, සේවකයන්ගෙන් වන්දි මුදල් එක්රැස් කිරීම, ආබාධිත හෝ රෝගවලින් පීඩා විඳින සේවකයන්ට නැතහොත් මියගිය සේවකයන්ගේ යැපෙන්නන්ට එම වන්දි මුදල් ගෙවීම අමාත්‍යාංශයේ කාර්යභාරයයි.

ආඥා පනතේ විධිවිධානයන්ට අනුව වන්දි මුදල් ගෙවීමට අදාළ පරීක්ෂණ පැවැත්විය යුත්තේ හදිසි අනතුරු සිදු වී ඇති ප්‍රදේශයේ දීම ය. ඒ සඳහා දිවයිනේ බොහෝ ප්‍රදේශවල දී ජංගම අධිකරණ පවත්වනු ලැබේ. දරුණු හදිසි අනතුරු සම්බන්ධයෙන් වන්දි මුදල් ගෙවීම අනුමත කළ යුත්තේ කම්කරු වන්දි කොමසාරිස්වරයා මගිනි. එහෙත් මාරාන්තික නොවන හදිසි

**කම්කරු වන්දි ඉල්ලමින් ඉදිරිපත් කෙරෙන පැමිණිලි බාර ගැනීම, පිළිගත් වන්දි ඉල්ලීම් පිළිබඳ පරීක්ෂණ පවත්වා එම ඉල්ලීම් ලබාදීමෙන් හෝ ප්‍රතික්ෂේප කිරීමෙන් ගැටලුව විසඳීම, සේවකයන්ගෙ න් වන්දි මුදල් එක්රැස් කිරීම, ආබාධිත හෝ රෝගවලින් පීඩා විඳින සේවකයන්ට නැතහොත් මියගිය සේවකයන්ගේ යැපෙන්නන්ට එම වන්දි මුදල් ගෙවීම අමාත්‍යාංශයේ කාර්යභාරයයි.**

**නියමිත වයස සීමාවට එළඹ නැති දරුවකුගේ අධ්‍යාපනය, නඩත්තුව සහ වෛද්‍ය ප්‍රතිකර සඳහා එම දරුවාට මුදල් සහාය අවශ්‍ය බවට සාක්ෂි ඇති විට එම බාල වයස්කාර යැපෙන්නන්ගේ බැරට බැංකුවේ ඇති මුදලට ලැබෙන පොලිය කම්කරු වන්දි කොමසාරිස් වරයාගේ අභිමතය පරිදි එම දරුවාගේ භාරකරුවන්ට ගෙවිය හැකි ය.**

අනතුරුවලට අදාළ වන්දි මුදල් කම්කරු වන්දි කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව ආබාධිත සේවකයන්ට හා රෝගී සේවකයන්ට කෙළින් ම ගෙවිය හැකි ය.

එසේ කෙළින්ම මුදල් ගෙවනු ලබන අවස්ථාවල දී සේව්‍ය - සේවක දෙපක්ෂයෙන් ම එකඟත්වය ඇති ව මුදල් ගෙවූ බව ප්‍රකාශ වන සන්දේශයක් අත්සන් කොට කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු වේ.

මිය ගිය සේවකයන්ගේ බාල වයස්කාර යැපෙන්නන්ගේ යහපත තකා ඔවුන්ට ගෙවිය යුතු මුදල් කම්කරු කොමසාරිස්වරයාගේ භාරකාරත්වය යටතේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කෙරේ. ඔවුන්ගේ වයස අවු. 18 සම්පූර්ණ වූ විට එම බැංකු පොත් ඔවුන්ට භාර දීමට කටයුතු කෙරේ. නියමිත වයස සීමාවට එළඹ නැති දරුවකුගේ අධ්‍යාපනය, නඩත්තුව සහ වෛද්‍ය ප්‍රතිකාර සඳහා එම දරුවාට මුදල් සහාය අවශ්‍ය බවට සාක්ෂි ඇති විට එම බාල වයස්කාර යැපෙන්නන්ගේ බැරට බැංකුවේ ඇති මුදලට ලැබෙන පොලිය කම්කරු වන්දි කොමසාරිස්වරයාගේ අභිමතය පරිදි එම දරුවාගේ භාරකරුවන්ට ගෙවිය හැකි ය.

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

1985 අංක 21 දරන විදේශ රැකි පණත, 1994 අංක 4 දරන සංශෝධිත පණත සහ 2009 අංක 56 දරන සංශෝධිත පණත යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ද ස්ථාපිත කර තිබේ. රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අභිවෘද්ධිය සහ සුභසාධනය උදෙසා මූලික වී කටයුතු කිරීම මෙහි වගකීම ලෙස දැක් වේ.

මුලින් මේ ආයතනය පැවතුණේ කම්කරු අමාත්‍යාංශය යටතේ ය. 2007 දී මෙය විදේශ රැකියා ප්‍රවර්ධන සහ සුභසාධක අමාත්‍යාංශය වෙතට පවරා දෙන ලදී. විදේශ රැකියා සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාත්මක කිරීම සහ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි කාර්යයන් මේ මගින් සිදු කෙරේ. ප්‍රධාන කාර්යාලයට අමතර ව

**2009 අංක 56 දරන සංශෝධිත පණත යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ද ස්ථාපිත කර තිබේ. රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අභිවෘද්ධිය සහ සුභසාධනය උදෙසා මූලික වී කටයුතු කිරීම මෙහි වගකීම ලෙස දැක් වේ.**

**විදේශ සේවායෝජකයන් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වෙත ලබා දෙන ගිවිසුම් සඳහා ප්‍රමිතීන් පැනවීම, ඒවා සඳහා අනුමැතිය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අභිවෘද්ධිය හා සුභ සාධනය උදෙසා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මේ මගින් ඉටු වේ.**

ප්‍රාදේශීය කාර්යාල 7 ක් මගින් සේවා සැපයේ.

විදේශ සේවායෝජකයන් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වෙත ලබා දෙන ගිවිසුම් සඳහා ප්‍රමිතීන් පැනවීම, ඒවා සඳහා අනුමැතිය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අභිවෘද්ධිය හා සුභ සාධනය උදෙසා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මේ මගින් ඉටු වේ.

රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන්, විදේශීය සේවක සේවිකාවන් සහ ශ්‍රී ලාංකික රැකියා ඒජන්තවරුන්ගේ සවිස්තර දත්ත ගබඩා පවත්වාගෙන යාම, සම්මත ගිවිසුම් නිර්මාණය කිරීමේ සහ පුහුණු මධ්‍යස්ථාන 29 ක් මගින් විදේශගත වීමට පෙර හඳුන්වා දීමේ වැඩසටහන් පැවැත්වීම, මෙරටින් කම්කරුවන් සපයනු ලබන රටවල් සමග ශ්‍රමිකයන්ට වාසිදායක වන අයුරින් අවබෝධතා ගිවිසුම් ඇතිකිරීම සහ රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන් ලියාපදිංචි කිරීම, විදේශ ගතවීමට පෙර හඳුන්වා දීමේ මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ඉටු කෙරෙන වගකීම් අතර වේ.

මැදපෙරදිග රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරය ග්‍රාමීය හෝ අර්ධ නාගරික පසුබිමක් ඇති නුපුහුණු ශ්‍රමිකයන්ගෙන් සමන්විත ය. මේ නිසා, අඩු වැටුප් ලැබීම, හිංසාවන්ට ලක්වීම, දැනුමේ මඳකම නිසා සේව්‍යයා සමග ගැටුම් ඇතිවීම, තානාපති කාර්යාලවල නිලධාරීන්ගේ ද අඩන්තේට්ටම්වලට ලක්වීම යනා දී ගැටලුවලට මුහුණ දෙන අවස්ථා බහුල විය. ජීවිත හානි සිදු වූ අවස්ථා ද ඇත.

**අඩු වැටුප් ලැබීම, හිංසාවන්ට ලක්වීම, දැනුමේ මඳකම නිසා සේව්‍යයා සමග ගැටුම් ඇතිවීම, තානාපති කාර්යාලවල නිලධාරීන්ගේ ද අඩන් තේට්ටම්වලට ලක්වීම යනා දී ගැටලුවලට මුහුණ දෙන අවස්ථා බහුල විය. ජීවිත හානි සිදු වූ අවස්ථා ද ඇත.**

මේ තත්ත්වය වළක්වා ගනු පිණිස මෑත දී විදේශ සේවා නියුක්ති කාර්යාංශය වැඩ පිළිවෙලක් සකස් කළේ ය. ඒ අනුව රැකියා ඒජන්සිවල තත්ත්වය සොයා බලා ගැටලු ඇති ආයතනවල බලපත්‍ර අහෝසි කිරීමට පියවර ගනිමින් සිටී. නුපුරුදු ශ්‍රමිකයන් වෙනුවට NVQ මට්ටම ඇති ශ්‍රමිකයන්ට ප්‍රමුඛ අවස්ථාවක් ලබා දේ. එමෙන් ම අවුරුදු 5 ට වඩා අඩු දරුවන් සිටින මව්වරුන් විදේශගත වීම වැළැක්වීමට පියවර ගෙන ඇත.



රාජ්‍ය භාෂාව ඇගයීම, දිරිගැන්වීම සහ එහි තරාතිරම, සමානත්වය, භාවිතයේ අයිතිවාසිකම් පිළිගැනීම, එසේ පවත්වාගෙන යෑම සහ රාජ්‍ය භාෂා මූලික අයිතිවාසිකමක් ලෙස ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම, කොමිසම විසින් ම හෝ පුරවැසියන් විසින් කරන ලද පැමිණිලි විභාග කිරීම හා ප්‍රතිකර්ම යෙදීම කොමිසමේ වගකීම ය.

## රාජ්‍ය භාෂා කොමිසම

2010.11.25 දින 1681/03 අංක දරන ගැසට් නිවේදනය මගින් පිහිටුවන ලද ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතන තුනෙන් එකක් වන්නේ රාජ්‍ය භාෂා කොමිසමයි. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ vi පරිච්ඡේදයේ ඇතුළත් විධිවිධාන අනුව ක්‍රියාකිරීම ගැන විමසීම සහ අධීක්ෂණය කිරීම කොමිසමේ අරමුණ ය. රාජ්‍ය භාෂාව ඇගයීම, දිරිගැන්වීම සහ එහි තරාතිරම, සමානත්වය, භාවිතයේ අයිතිවාසිකම් පිළිගැනීම, එසේ පවත්වාගෙන යෑම සහ රාජ්‍ය භාෂා මූලික අයිතිවාසිකමක් ලෙස ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම, කොමිසම විසින් ම හෝ පුරවැසියන් විසින් කරන ලද පැමිණිලි විභාග කිරීම හා ප්‍රතිකර්ම යෙදීම කොමිසමේ වගකීම ය.

පුරවැසියන්ගේ භාෂා අයිතීන් කඩවීම සම්බන්ධයෙන් කොමිසමට පැමිණිලි කළ හැකි ය. එනම්

(අ) යම් රාජ්‍ය භාෂාවක නිසි තත්ත්වය පිළිගැනීම සිදු නොවන බව හෝ සිදුවී නැති බව හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දක්වා ඇති අයිතිවාසිකම් අනුව ක්‍රියා නොකරන බව පෙනීම.

(ඇ) පණතක විධිවිධාන අනුව කරන ලද නියෝගයක්, රීතියක්, නිගමනයක්, පරිපාලන විධානයක් අනුව ක්‍රියා නොකරන බව පෙනීම.

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv පරිච්ඡේදයේ පරමාර්ථ අනුව ක්‍රියා නොකරන බව.

සම්බන්ධයෙන් කොමිසම විභාග කළ යුතු ය. සාධාරණ හේතු මත පැමිණිලි ප්‍රතික්ෂප කළ හැකි ය. ඒ අනුව ප්‍රතික්ෂේප කිරීමට හේතුව පිළිබඳව පැමිණිලිකරුට දන්විය යුතු ය.

දින 14 ක් තුළ, යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නිසා

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඩ පරිච්ඡේදයේ පරමාර්ථ අනුව ක්‍රියා නොකරන බව සම්බන්ධයෙන් කොමිසම විභාග කළ යුතු ය. සාධාරණ හේතු මත පැමිණිලි ප්‍රතික්ෂප කළ හැක. පැමිණිලිකරුට පෙර දැක්විය යුතු ය.**

**විමර්ශනයක් පැවැත්වීමේ දී තමන්ට ඇහුම්කන් දිය යුතු ය යන අයිතිවාසිකමක් පැමිණිලිකරුට නැත.**

බලපෑමක් ඇති වූ පුද්ගලයකුට හෝ කණ්ඩායමකට පැමිණිල්ලක් කළ හැකි ය.

පැමිණිලිකරුට අවශ්‍ය නම් ඔහුගේ රහස්‍ය බව ආරක්‍ෂා වන පරිදි විභාගය පැවැත්විය හැකි ය.

21, 22 වැනි වගන්තිවල කොමිසමේ බලතල මෙසේ දැක්වේ.

(අ) සාක්ෂිකරුවන් කැඳවීම හා අදාළ ලේඛන ඉදිරිපත් කිරීමට නියෝග දීම.

(ආ) දිවුරුම් පිට සාක්ෂි දීම

(ඇ) අධිකරණයක දී දෙන සාක්ෂි වශයෙන් නොසලකා තොරතුරු භාරගැනීම හා සලකා බැලීම කළ හැකි ය.

(ඈ) සුදුසු ස්ථානයක දී විමර්ෂණය කළ හැකි ය.

22 (1) විමර්ශනයක් පැවැත්වීමේ දී තමන්ට ඇහුම්කන් දිය යුතු ය යන අයිතිවාසිකමක් පැමිණිලිකරුට නැත.

(2) යම් පුද්ගලයකුට හෝ ආයතනයක් කෙරෙහි බලපාන නිර්දේශයක් කළ යුතු අවස්ථාවක ඒ

පුද්ගලයාට හෝ ආයතනය ප්‍රතිචාරයක් දැක්වීමේ අවස්ථාවක් දිය යුතු ය.

**විමර්ශනය කළ ක්‍රියාව හෝ නොකර හැරීම ගැන සලකා බැලීම හා ක්‍රියා කිරීම සඳහා අදාළ ආයතනය වෙත යොමු කළ යුතු ය.**

23 (1) විමර්ශනයෙන් පසු

(අ) විමර්ශනය කළ ක්‍රියාව හෝ නොකර හැරීම ගැන සලකා බැලීම හා ක්‍රියා කිරීම සඳහා අදාළ ආයතනය වෙත යොමු කළ යුතු ය.

(ආ) යම් නියමයක් නැවත සලකා බැලිය යුතු බව, යම් පුරුද්දක් වෙනස් කළ යුතු බව හෝ නවතා දැමිය යුතු බව හෝ වෙනත් ක්‍රියාවක් කළ යුතු බව ඊට හේතු ද සමග ආයතන ප්‍රධානියාට වාර්තා කළ යුතු ය.

3. පැමිණිල්ලක් ගැන දින 60 ක් තුළ දී වාර්තාව ඉදිරිපත් කළ යුතු ය. බාහිර හේතු නිසා ප්‍රමාද වුවහොත් එම හේතු සමග අතුරු වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

4. කුමන හේතු තිබුණත් පැමිණිල්ල ඉදිරිපත් කොට දින 120 ඇතුළත අවසාන වාර්තාව පැමිණිලිකරුට පිටපතක් සහිත ව ඉදිරිපත් කළ යුතු ය.

**භාෂා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ස්ථාපිත විධිවිධානයන්හි කුමක් තිබුණත් පුරවැසියාගේ පාර්ශ්වයෙන් එම අයිතිවාසිකම කඩවන අවස්ථා බොහෝ ය.**

5. වාර්තාව සමග කොමිසමේ නිර්දේශ ද දැක්විය හැකි අතර ඒවා ක්‍රියාත්මක කරන ආකාරය ගැන රජයේ ආයතනය කොමිසම වෙත දැනුම් දීමට විධාන කළ හැකි ය.

භාෂා අයිතිවාසිකමක් සකස්වීම සම්බන්ධයෙන් 24(1) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ හැකි ය.

25 (1) අනුව මහාධිකරණයේ නඩුවක් පැවරීම කළ යුත්තේ රාජ්‍ය භාෂා කොමසාරිස්වරයා ය.

29 (1) රාජ්‍ය භාෂා කොමිසන් සභා පණත අනුව කොමිසමට පැමිණිලි නොකර කෙළින් ම මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරිය හැකි ය.

භාෂා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ස්ථාපිත විධිවිධානයන්හි කුමක් තිබුණත් පුරවැසියාගේ පාර්ශ්වයෙන් එම අයිතිවාසිකම කඩවන අවස්ථා බොහෝ ය.

රාජ්‍ය භාෂා කොමිසමට පැමිණිලි ඉදිරිපත් කළ පුද්ගලයෙක් හැටියට මගේ අත්දැකීම බොහෝ පැමිණිලි

විභාගය සිදුවන්නේ මන්දගාමීව බවයි. දින 120 පිරුණු බොහෝ පැමිණිලි සංඛ්‍යාවක් කිසිදු පිළිතුරක් නොමැතිව තවමත් කොමිසන් සභාවේ පවතී.

උදාහරණයක් වශයෙන් ත්‍රෛභාෂාවෙන් හෝ ද්විභාෂාවෙන් මුද්‍රණය නොකරන ලද දැන්වීම් පුවරු දිවයිනේ බොහෝ තන්හි තරමක් දක්නට ලැබේ. එමෙන් ම ඇතැම් රාජ්‍ය ආයතනවල නිල දැනුම්දීම් තවමත් සිදු කෙරෙන්නේ සිංහල භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

රාජ්‍ය නිලධාරීන්ගේ ඇතැම් සාකච්ඡා තවමත් සිදුවන්නේ සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පමණි.

2013 වසර සඳහා වූ ප්‍රථම මඩකලපු දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේ සියලු ලිපි හා වාර්තා දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු බව පාර්ලිමේන්තු මන්ත්‍රී යෝගේෂ්වරන් මහතා ප්‍රකාශ කළේ ය. හැටන් කලාප අධ්‍යාපන කාර්යාලයේ ලිපි ලේඛන සිංහල භාෂාවෙන් පමණක් තිබීම නිසා දෙමළ ගුරුවරුන් දුෂ්කරතාවට පත්ව ඇති බව ලංකා ගුරු සංගමය වාර්තා කර ඇත.

**අපගේ මඟපෙන්වීම යටතේ පැවරූ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකට අනුව 2014 ජනවාරි 01 සිට ද්විභාෂාවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීමටත් තවත් වසරක් ගිය පසු සියලුම හැඳුනුම්පත් ත්‍රෛභාෂිතව ඉදිරිපත් කිරීමටත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජෙනරාල්වරයාට ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග කිරීම ශ්‍රී ලංකාවේ භාෂා අයිතිය පිළිබඳව වැදගත් ජයග්‍රහණයකි.**

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන මුදල් නෝට්ටුව සිංහල වාක්‍ය කිහිපයකට අනුරූපී දෙමළ වාක්‍ය නොතිබීම සම්බන්ධයෙන් උසස් පෙළ ශිෂ්‍යයෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කළේ ය. 1985 න් පසුව ආයතන සංග්‍රහයට ඇතුළත් කර ඇති නව සංශෝධනය සිංහල භාෂාවෙන් පමණක් මුද්‍රණය කර ඇත.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත සම්බන්ධයෙන් මෙතෙක් පැවතියේ සිංහල භාෂාවෙන් පමණක් කටයුතු කිරීමයි. අපගේ මඟපෙන්වීම යටතේ පැවරූ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකට අනුව 2014 ජනවාරි 01 සිට ද්විභාෂාවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීමටත් තවත් වසරක් ගිය පසු සියලූම හැඳුනුම්පත් ත්‍රෛභාෂිතව ඉදිරිපත් කිරීමටත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්ජෙනරාල්වරයාට ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග කිරීම ශ්‍රී ලංකාවේ භාෂා අයිතිය පිළිබඳව වැදගත් ජයග්‍රහණයකි.

## ශ්‍රී ලංකාවේ පුරවැසියන්හට තම දුක්ගැනවිලි ඉදිරිපත්කිරීමට ඇති ආයතන

1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව
177, නාවල පාර, නාරාහෙන්පිට,කොළඹ 05.
Tel : 011-2136600 , 011-2136650, 011-2136700
Fax : 011-2369302, 011-2369305

2 පරිපාලන අභියාචන විනිශ්චය සභාව
අංක 05, ඩඩ්ලි සේනානායක මාවත
කොළඹ 08.

3 පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
330, යූනියන් පෙදෙස, කොළඹ -02
94 -11-2305326 , +94 -11-2305327, 2347529
Email : info@pclg.gov.lk

4 පාරිභෝගික කටයුතු අධිකාරිය
1 වැනි සහ දෙවැනි මහල, 27, වොක්ෂෝල් වීදිය, කොළඹ -02.
Telephones -011-2445897 / 011-2393495 / +94-11-2393577
Hot Line +94-11-3134446-8
Fax Nos : +94-11-2399148 / +94-11-2321696
Email : chairmancaa@sltnet.lk / dgcaa@sltnet.lk
Website : www.consumeraffairs.gov.lk

5 රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
4 වැනි මහල, "භාෂා මන්දිරය", 341/7,
කෝට්ටේ පාර, රාජගිරිය.
TP-2864214, Fax-011-2871379

6 මානව හිමිකම් කොමිසම
165, කිංසි පාර, බොරැල්ල,කොළඹ 08.
0094112694925, 2685980, 2685981 0094112696470
Email: sechrc@sltnet.lk / Web: www.hrcsl.lk

7 මහජන පෙත්සම් කාරක සභාව
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
0094-11-2777302 0094-11-2777558
Email: shyama_f@parliment.lk

8 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව
36, මලලසේකර මාවත,කොළඹ -07, ශ්‍රී ලංකාව.
+94-11-2559923, +94-11-2596360
+94-11-2586257-(1954)
Email: ciaboc@eureka.lk / sccy@sltnet.lk

9. ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.
94112354354

10. අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය
තැ.පෙ. අංක 573,හල්ෆ්ට්ස්ඩෝර්ප්.කොළඹ 12
+94 11 2433119 / +94 11 2451159
sjsc@sltnet.lk

11. සමථ මණ්ඩලය
421-02, ශ්‍රී බෞද්ධාලෝක විහාරය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
0112 693380

12. කම්කරු වන්දි කොමසාරිස් ,
128,ලොරිස් පාර,කොළඹ 04.
0112 599662
Fax : + 94 011-2432735

13. ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය
330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර,
Tele: 2778911- 4
Email : ncpa@childprotection.gov.lk
Web : www.childprotection.gov.lk

14. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
150, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ - 05.
Telephone : +94 112369011 to 14
Fax : 0112369343
Email : sgsurv @ sltnet.lk

15. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
129, මහාධිකරණ සංකීර්ණය,අළුත් කඩේ,කොළඹ 12.
+94-11-5335329 / +94-11-5335281
+94-11-2433618
Email : legalaid@sltnet.lk
www.legalaidcommission.com

16. 12. පාරිභෝගික කටයුතු අධිකාරිය
1 වැනි සහ දෙවැනි මහල ,27, වොක්ෂෝල් වීදිය ,කොළඹ -02.
Telephones -011-2445897 / 011-2393495 / +94-11-2393577
Hot Line +94-11- 3134446-8
Fax Nos : +94-11-2399148 / +94-11-2321696
Email : chairmancaa@sltnet.lk / dgcaa@sltnet.lk
Website : www.consumeraffairs.gov.lk

17. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
17, වික්ටෝරියා පෙදෙස (විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවට යාබද පටු මාවත) ඇල්විටිගල මාවත,කොළඹ -08 .
TEL - 0112671567-72

18. මධ්‍යම පරිසර අධිකාරිය
නෙල්සන් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව
Tel: 011-7877277, 7877278, 7877279, 7877280
Hotline: 011-2888999

19 නාගරික සංවර්ධන අධිකාරිය
6 වැනි සහ 7 වැනි මහල්, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
+94 11 2875916 to +94 11 2875920, +94 11 2873
f: 011 2873637 e: infosys@uda.lk w: www.uda.lk

20. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)
අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ - 08
+94 11 2689345 Email: dgtsl@trc.gov.lk
Web: http://www.trc.gov.lk

21. ජාතික ප්‍රවාහන කොමිසන් සභාව
241, උද්‍යාන පාර (Park Road),කොළඹ - 05
+94 011 2595555 (Hotline), 0777 595 555 (Mobile Hotline),
+94 011-2587372
+94 011 2503969, + 94 011 2503725 (fax)
info@ntc.gov.lk

22. ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව
6 වැනි මහල, ලංකා බැංකු මර්චන්ට් ටවර්, අංක-28,
ශාන්ත මයිකල් පාර, කොළඹ - 03
(+94 11)2392607/8 (+94 11)2392641
info@pucsl.gov.lk

23. බදු ඔම්බුඩ්ස්මන්ඩ්
143-ඒ, වජිර පාර,කොළඹ 05
දුරකථන 0114 528671, 0112505542

24. ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන්
143-ඒ, වජිර පාර,කොළඹ 05
+94 11 259 5625 / +94 11 259 5624
fosril@sltnet.lk
www.financialombudsman.lk

25. ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
143-ඒ, වජිර පාර,කොළඹ 05
+94 11 452 8671, +94 11 250 5542 +94 11 452 8670
94 11 259 5625
www.insuranceombudsman.lk
info@insuranceombudsman.lk

26. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,11 වන මහල,
නැගෙනහිර කුළුන, කොළඹ -01
011 2396184 - 9 / 011 2396190
fax-239619 email-chaya@ibsl.gov.lk

27. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතීන් නිරීක්ෂණ මණ්ඩලය,
3 වන මහල, බයිබල් නිවාස,293, ගාලු පාර්, කොළඹ -03
94-1-2301210 94-1-2301211
slaasmb@sltnet.lk

28. සභාධිපත්‍ය කලමනාකරණ අධිකාරිය
ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල.
චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, 1 වන මහල, කොළඹ 02
+94-11-2447432 , +94-11-2447429 +94-11-2423606
http://www.condominium.lk

29. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
04, හුනුපිටිය පාර, කොළඹ.
94-11-2358800 / 94-11-2304632
94-11-2304644
info@caa.lk
http://www.caa.lk

**30.** ශ්‍රී ලංකා සාගර දූෂණය වැලැක්වීමේ අධිකාරිය
සමුද්‍ර පරිසර ආරක්‍ෂණ අධිකාරිය
758, 1වන මහල,
බේස්ලයින් පාර,
කොළඹ -09
0094 11 4896911/(09411 4615960 fax)
09411 4615960(fax)

**31.** ශ්‍රී ලංකා - සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
ලෙවල් 28 සහ 29 මහල, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඊස්ටන්
චතුරශ්‍රය, කොළඹ 01.
+94 11 2331013 - 6, +94 11 2439144 – 8
+94 11 2439149
mail@sec.gov.lk

32. පුවත්පත් මණ්ඩලය
155/15, කාසල් වීදිය, කොළඹ 08.
011-2693271(fax)

33. වෙරළ සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව
80, ගාලුපාර, කොළඹ -03
+94 112426900 / 2437055/59/60
+94 112 440001 / 2426984
info@sltda.gov.lk

34. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
25, ගාලු මුවදොර ටෙරසය,
කොළඹ 03
094 11 2390645 -8 (Gen), 2390653 (Dir)
094 11 2390649
gemautho@sltnet.lk

35. සමූපකාර සේවකයන්ගේ කොමිසම
තැ.පෙ. 1528, 100/1/1,
ලෝහර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.
94 11 2396206
+94 11 2396208
cecsec[at]sltnet.lk

36. ශ්‍රී ලංකාවේ නීතිපති තුමා,
තැ.පෙ. 502,
හල්ෆ්ස්ඩෝර්ප්,
කොළඹ - 12
+94 (11) 2147888 DSG(Administration)
+94 11 242 4894 SSC(Administration)
+94 11 243 3964
+94 (11) 243 6421
administration@attorneygeneral.gov.lk
http://www.attorneygeneral.gov.lk

37. ණය සහන මණ්ඩල දෙපාර්තමේන්තුව
80, අධිකරණ මාවත,
කොළඹ 12
011-2334816, 011-2334815, 011- 2334816
debtconciliation@gmail.com

38. ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යංශය
234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.
ප්‍රධාන කාර්යාලයः + 94 112 864101 – 105, +94 112880500
සහන පියස අංශයः +94 112 259953
24 Hour Service: 1989 (Local Calls Only)
+94 11 2879900 – 902, + 94 11 2879903
infor_center@slbfe.lk

39. ජාතික පොලිස් කොමිෂන් සභාව
බ්ලොක් අංක 09 BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත, කොළඹ -07
(+94) 011 2683307, (+94) 0115107721, (+94)0115107722
(+94) 011 2683307, (+94) 01157107723,
Informationinfo@npc.gov.lk ,
Public Complaintscomplaints@npc.gov.lk

40. ශ්‍රී ලංකා මැතිවරණ දෙපාර්තමේන්තුව
මැතිවරණ මහලේකම් කාර්යාලය
තැ.පැ. අංක 02, සරණ මාවත, රාජගිරිය
011-2868441, 011-2868442, 011-2868443
011-2868426
election@slt.lk
www.slelections.gov.lk

41. කම්කරු දෙපාර්තමේන්තුව
කම්කරු මහලේකම් කාර්යාලය,
නාරාහේන්පිට, කොළඹ 05.
+94-11-2581142 / +94-11-2581143
0094-11-2581145
doldevlop@sltnet.lk

42. ගොවිජන සේවා කොමසාරිස් ජෙනරාල්
ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව
43, ශ්‍රීමත් මාකස් ෆැනෑන්ඩෝ මාවත,
කොළඹ 07.
+94112691060, +94112695595
+94771817478 94112693572
commissionerdad@yahoo.com

44. මිණුම් ඒකක, ප්‍රමිතීන් සහ සේවා දෙපාර්තමේන්තුව
101, උද්‍යාන පාර (Park Road),
කොළඹ - 05
94-1- 2583261 /2597757 / 2587190 /2588914
94-1-2597756
metrolad@sltnet.lk

45. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය
148, වෝක්ශෝල් වීදිය, කොළඹ - 02.
+94 112 131313
94 112 338259
info@crib.lk
http://www.crib.l

46. ශ්‍රී ලංකාවේ නීතිපති තුමා,
තැ.පෙ. 502, හල්ෆ්ස්ඩෝර්ප්, කොළඹ - 12
+94 (11) 2147888 DSG(Administration)
+94 11 242 4894 SSC(Administration)
+94 11 243 3964
+94 (11) 243 6421
administration@attorneygeneral.gov.lk
http://www.attorneygeneral.gov.lk

47. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
C. 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.
0112694251/0112672273
0112693438/698849
ircaadmin@sltnet.lk

48. වනසංරක්‍ෂණ දෙපාර්තමේන්තුව
"සම්පත්පාය", 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

49. ජනාධිපති විමර්ශන ඒකකය
11, ජාවත්ත පාර, කොළඹ -05,
0112595622

ශ්‍රී ලංකාවේ සියලුම පළාත් සභාවන්හි මහජන පෙත්සම් කාරකසභාවන්ටද. ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ටද පැමිණිළි කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


- ඔම්බුඩ්ස්මන්ඩ්ගේ කාර්යභාර්ය- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- භාෂාව හා මනුෂ්‍යත්වය- එස්.ජී.පුංචිහේවා මහතා
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ ඒ හා සම්බන්ධ නීතිය
- LLRC වාර්තාව-උගත්පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග
- වයඹ ඡන්දය හා සමාජ අභියෝගය-තිඹිරියාගම බණ්ඩාර
- දොන් රංජිත් දේශප්‍රිය එදිරිව ප්‍රාදේශීය ලේකම් දොඩංගොඩ සහ තවත් අය නඩු තීන්දුව(සමෘද්ධි සේවක)
- අනුරාධ ප්‍රසාද් ධනංජය ගුරුගේ නඩුතීන්දුව (පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව-ජාතික හැදුනුම්පත්)
- විවේචනාත්මක විශ්ලේෂණයක් - ආචාර්ය ඇන්.ඇම්.පෙරේරා
- ශිෂ්ඨාචාරයක මිනීවල කැනීම-තිඹිරියාගම බණ්ඩාර
- පුරවැසි අත්වැල - Transparency International Sri Lanka

ISBN 955-978-4746-29-9